# වාර්ෂික වාර්තාව 2011

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ஆண்டறிக்கை 2011

## முகாமைத்துவ பட்டப்பின்படிப்பு நிறுவகம்

## ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்

# Annual Report 2011

## POSTGRADUATE INSTITUTE OF MANAGEMENT

## University of Sri Jayewardenepura

# වාර්ෂික වාර්තාව

# 2011

PIM

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

## හැඳින්වීම

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (පී.අයි.එම්) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයට අනුබද්ධ ව පිහිටවනු ලැබූ අර්ධ-ස්වාධීන ආයතනයකි. මෙම ආයතනයේ අරමුණ වනුයේ විවිධ කළමනාකරණ හා පරිපාලන විෂය ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි උපදේශන, පුහුණු හා පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවෙහි කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය හා වෘත්තිකත්වය ප්‍රවර්ධනය කිරීම යි. ජ්‍යෙෂ්ට මට්ටමේ දහස් සංඛ්‍යාත කළමනාකරුවනට හා පරිපාලකයනට, අධ්‍යාපන හා නිපුනතා වර්ධනය සඳහා අභියෝගාත්මක අවස්ථා සපයමින්, මෙ ම ආයතනය වඩා පුළුල් පදනමක් මත, වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ වර්තමාන ජාතික අවශ්‍යතා සපුරාලයි. ශ්‍රී ලංකාවෙහි උසස් කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ පුරෝගාමියා ලෙසින්, කළමනාකරණ ඥානය, නව්‍යකරණයෙහි හා ව්‍යාප්තියෙහි නියැලුණවුන් හට, මෙන් ම උසස් දැනුම් විකල්ප ගවේෂණය කරන්නන්හට, නායකත්වය සපයයි.

1978 විශ්වවිද්‍යාල පනත යටතේ අතුරු විධානයෙකින් 1986හි දී පිහිටුවනු ලැබූ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්නා පශ්චාත් උපාධි ආයතන හතට ඇතුළත් වන්නකි. සාපේක්ෂ වශයෙන් එ තරම් කල් පසු කළ ආයතනයක් නොවුව ද, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය උක්ත ආයතන අතුරින් වැඩිම ශිෂ්‍ය-සංඛ්‍යාවක් ඇති ආයතනය වන අතර, මෙ රට විශ්වවිද්‍යාල පද්ධතියෙහි එකම ස්ව-මූල්‍ය උත්පාදන උසස් අධ්‍යාපන ආයතනය වන්නේ ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි, 1981 දී පශ්චාත් උපාධි ආයතන ඒකකය පිහිටුවීම දක්වා මෙම ආයතනයෙහි ආරම්භය ඇදී යයි. කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය පදනම යටතේ කැනේඩියානු විශ්වවිද්‍යාල දෙකක් වන ඔටාව විශ්වවිද්‍යාලයයේත්, කාල්ටන් විශ්වවිද්‍යාලයයේත් සහයෝගිත්වයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු මෙමෙ ඒකකයෙන් ආරම්භ කරන ලදි. මෙම ඒකකය, 1986 දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය තුළ, ස්වාධීන ආයතනයක් ලෙසට උසස් කරන ලදි. 1995 දී මෙම ආයතනය කොළඹ 08, හි වූ ලෙස්ලි රණගල මාවතේ පිහිටි අළුතින් ඉදි කරන ලද ගොඩනැඟිල්ලට ගෙන යන ලදි.

## අභිප්‍රාය

ඉදිරි පස්-අවුරුදු කාලය තුළ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි කාර්ය මෙහෙයැවනුයේ දකුණු ආසියානු හා මැද පෙරදිග ප්‍රදේශයන්හි කළමනාකරණය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රය බවට පත්වීමේ අපේක්ෂාවෙනි.

ශ්‍රී ලංකාවෙහි මේ දක්වා කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා දීමේ හා වර්ධනය කිරීමේ විශිෂ්ටත්ව කේන්ද්‍රය බවට පත්වීම සඳහා මේ දක්වා වූ ආයතනික ප්‍රගතිය අනුව, උක්ත අභිප්‍රාය සහේතුක වෙයි. ආයතනයේ ඊළඟ වර්ධනීය අවස්ථාව වනුයේ කලාපය තුළ කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම ආයතනය බවට පත්වීමෙහි ලා කැප වීමයි.

## මෙහෙවර

අපගේ මෙහෙවර වනුයේ පස්-විධ පිළිවෙත වන දැක්ම, ප්‍රයත්නය, සුසංයෝගය, සංයමය හා සැලැකිල්ල ඔස්සේ කළමනාකරණ අධ්‍යාපනය හැඩගැස්වීම යි. අපගේ සමස්ථ කර්තව්‍යය වනුයේ මෙ ම පස්-විධ ප්‍රවේශය ඔස්සේ සිය ස්ත්‍රී සහ පුරුෂයන්ගේ ශක්තීන් මෙහෙයවන නායකයන් නඟාලීම හා සමස්ත සමාජයෙහි යහපත උදෙසා, ඔවුන්ගේ ව්‍යවසායවල වටිනාකම වර්ධනය කළ හැකි කළමනාකරුවන් පිරිසක් බිහි කිරීම යි.

## වටිනාකම්

වර්තමානයෙහි ශිෂ්ට මිනිස් ප්‍රවර්ධනයට මෙම අංග අවශ්‍ය වන බව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි අපි දැඩි ව විශ්වාස කරමු.

- ✷ ප්‍රායෝගික ඥානයෙන් දැඩි ව පෝෂණය වුණු ඥානය පාදක කරගත් අධ්‍යයනය
- ✷ කාර්ය සාධනයට ඉවහල් වන නිපුණතා අඛණ්ඩ ව වර්ධනය කිරීම
- ✷ හික්මැවුණු වෘත්තිකත්වය උදෙසා අචල කැපවීම
- ✷ වටිනාකම නිර්ණය කිරීමේ පරමාර්ථය උදෙසා නවීකරණය කෙරෙහි දක්වන කැපවීම.

  අපගේ වැඩ සටහන් සංකල්ප පද්ධතියේ චතුර් ස්ථම්භ මේවා වෙයි. අපගේ ආයතනයේ අධ්‍යාපනය ලබන සියල්ලන්ගෙන් ම අප උදක්ම අපේක්ෂා කරනුයේ මෙම සංකල්ප පද්ධති මත පිහිටා කටයුතු කරන ලෙසයි.

ඉහතින් සඳහන් ලද ප්‍රතිලාභවලට පදනම් වනුයේ පහතින් දැක්වෙන පස්-විධ සාමූහික වටිනාකම් පද්ධතිය යි.

- ✷ අපගේ සෑම කටයුත්තක දී ම අවිශිෂ්ට බව වළකාලීම
- ✷ වටිනා බුද්ධි වර්ධනයෙහිලා ක්‍රියාකාරී වීම
- ✷ දැනුම අත්පත් කර ගැනීමෙහි මෙන් ම ඒ බෙදා හැරීමෙහි දී ද, නිර්මාණශීලී වීම
- ✷ අප ගේ සෑම කටයුත්තක දී ම, අඛණ්ඩ වැඩි දියුණුව
- ✷ අපගේ සියලු තීරණ හා ක්‍රියා සම්භන්ධයෙන් දක්වන අවංකභාවය හා විනිවිදභාවය

## අරමුණු

ඊළඟ පස්-වසර සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සිව්-විධ සාමූහික අපේක්ෂා වනාහි :-

- ✷ ආයතනය සිය කටයුතු මෙහෙයවීමට තෝරා ගන්නා වෙළෙඳ පොළෙහි අඛණ්ඩ ව ප්‍රමුඛයා වීම හා තරගකාරීත්වය අභිබැවීම, මෙන් ම, අඛණ්ඩ ව ජාතියේ ව්‍යාපාරික පාසල බවට පත් වීම.
- ✷ ප්‍රධාන අධ්‍යයන වැඩ සටහන් ප්‍රවාහයෙන් ඔබ්බට විහිදී ගොස්, කළමනාකරණ අධ්‍යයනයේ නැඟී එන ක්ෂේත්‍ර වෙත ව්‍යාප්ත වෙමින් ආයතනයේ අදාළත්වය තීව්‍ර කිරීම.
- ✷ සංවිධානවලට විශිෂ්ට වූ, කෙටි කාලීන විධායක ප්‍රවර්ධන වැඩ සටහන් මෙහෙයැවීමෙන්, තෝරා ගැනුණු ක්ෂේත්‍ර ඔස්සේ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම.
- ✷ අඛණ්ඩ ව අධ්‍යයන පාඨමාලාවල අදළත්වය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම

## අධ්‍යක්ෂකවරයා ගේ සමාලෝචනය

ආරම්භක අධ්‍යක්ෂකවරයා ගේ ප්‍රධානත්වයෙන්, පශ්චාත් උපාධි අධ්‍යයන ඒකකයේ හඳුන්වා දුන් විශේෂ වැඩ සටහන් ඔස්සේ, දැනට තිස් වසරක ට පෙර, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකාවට අවශ්‍ය කළමනාකරුවන් ප්‍රවර්ධනය කිරීමේ ජාතික මෙහෙවරට ප්‍රවිෂ්ට වූ අවස්ථාවේ දී ඉහළ මට්ටමෙක කළමනාකරණ අධ්‍යයනය සඳහා මෙරටෙහි එතරම් සැලකිල්ලක් නොවීය. එ හෙයින්, කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා කැනේඩියානු ජාත්‍යන්තර ඒජන්සිය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමෙන් පසු 1980 දශකයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මෙම ක්ෂේත්‍රයේ ඒකාධිකාරී ආයතනය බවට පත්විය. ඉන් තිස් වසරකට පසු එ නම්, දැන් එ ම වෙළෙඳ පොළ බෙහෙවින් වෙනස් වී ඇති අතර තරගකාරී සවභාවයක් ද උසුලයි.

අද වන විට, රටෙහි විශ්ව විද්‍යාල අටෙක ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය හා එ හා සමාන පශ්චාත් උපාධි පිරිනමයි. දොළහකට අධික පෞද්ගලික-විදේශීය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය හා සමඟ තරග කරයි. මෙ ම වැඩ සටහන්, විදේශ අරමුදල් යොදා ගනිමින් ප්‍රබල ව ප්‍රචාරණය කරන අතර, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන් සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය අය කරන ප්‍රමාණය මෙන් දෙගුණයකට ද වඩා ගාස්තු අය කරයි. මෙ ම තරගකාරීත්වය ඇති වනුයේ ප්‍රවේශ සුදුසුකම් පහත හෙළීමෙන් ද බාහිර දේශකයන් සඳහා දේශීය විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන් යොදවා ගැනීමෙන් ද, අපට ම අයත් දේට වඩා විදේශීය දේ විශිෂ්ට ලෙස සලකන දීන චින්තනයක් ඇති අයට පෙනෙන පරිදි උසස් යයි සැලැකෙන නම් යොදා ගැනීමෙන් ද වේ.

ස්වීය අරමුදලෙන් කටයුතු මෙහෙයවන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට, උක්ත කරුණු මහත් ම අභියෝගය එල්ල කරයි. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මුහුණ දෙන වේතන සීමාවලට හා සෙසු වියදම්වලට පෞද්ගලික ආයතන මුහුණ නොපායි. මීට අමතර ව වේතන, විදුලිය බිල්පත්, රක්ෂණ හා අය බදු, බාහිර කථිකාර්යවරුන්, ගොඩනැගිලි නඩත්තුව, ආරක්ෂක වියදම් හා උපකරණ, සම්පාදන, ප්‍රවාහන හා විගණන සඳහා වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ද උපයා ගැනීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට සිදු වී තිබේ. මෙය ශ්‍රී ලංකා රජයේ ඇති විශේෂිත අවස්ථාවක් සේ සලකනු වටී. එ නම්, රජයේ කාර්ය මණ්ඩලය ඔවුනට හිමි විය යුතු වැටුප් උපයා ගනිමින්, 26 ක් වූ සේවක සංඛ්‍යාවකින් ආයතනය මෙහෙයැවීමට සිදු වී තිබීම යි.

වසර තුළ දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මෙහෙයවන ලද්දේ 2009-11, ඒකාබද්ධ සැලසුම මත කළමනාකරණ අධ්‍යක්ෂක මණ්ඩලය විසිනි. මූලික බලපෑම් ඇති කරවන ක්ෂේත්‍ර වන පර්යේෂණ, උපාධි අධ්‍යාපනය පුහුණු කටයුතු හා ආයතනයේ ස්ව-මූල්‍ය උත්පාදන මත පවත්වා ගැනීමට ඉවහල් වන උපදේශන සේවා හා නව ආධ්‍යාපනික මෙහෙයුම් පිළිබඳ පොදු ප්‍රතිඵල දිරිගන්වනසුලු විය.

## අත්පත් කරගත් ප්‍රතිඵල

අපගේ අභිප්‍රාය වනුයේ, විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධිත කළමනාකරණ හා පරිපාලන අධ්‍යාපනය හා බැඳුණු පශ්චාත් උපාධි උපදේශන, පුහුණුව හා පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ වෘත්තීයකත්වය හා උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමයි. දහස් සංඛ්‍යාත ජ්‍යෙෂ්ට කළමනාකරුවනට හා පරිපාලකයනට ඉගැනුම් හා කුසලතා වර්ධනය සඳහා අභියෝගාත්මක අවස්ථා සපයමින්, අද දින කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වඩා පුළුල් ලෙස වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනයත් පුහුණුවත් පිළිබඳ ව වූ ජාතික මෙහෙවරට උර දී සිටී.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකාවේ ප්‍රාරම්භක උසස් කළමනාකරණ අධ්‍යාපන ආයතනය වෙමින් උසස් කළමනාකරණ ඥානය නිර්මාණය කිරීමත්, එ මෙන් ම ව්‍යාප්ත කිරීමත් අරමුණු කරගත් ව්‍යාපාරවල නියැළුණු හා උසස් අධ්‍යාපනය පිළිබඳ විකල්ප ගවේෂණයෙහි යෙදුණු අය හට නායකත්වය සපයයි.

දකුණු ආසියාවේ උසස් කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රමුඛයකු වෙමින් කළමනාකාරිත්වය පිළිබඳ ජාත්‍යන්තර තලයෙහි කළමනාකරණ ඥානයත්, ව්‍යවහාරයත් ප්‍රවේශ කරවීමේ වෑයමක අපි යෙදී සිටිමු.

අපගේ ප්‍රමුඛතම අරමුණ වනුයේ පස්-විධ පිළිවෙත වන දැක්ම, ප්‍රයත්නය, සුසංයෝගය, සංයමය හා සැලැකිල්ල ඔස්සේ කළමනාකරණ අධ්‍යාපනය හා නව්‍යකරණය හැඩගැස්වීම යි. අපගේ සමස්ත කර්තව්‍යය වනුයේ මෙ ම පස්-විධ ප්‍රවේශය ඔස්සේ සිය පුරුෂ හා කාන්තා ශක්තිය මෙහෙයවන නායකයන් නඟාලීම හා සමස්ත සමාජයෙහි යහපත උදෙසා ඔවුන්ගේ ව්‍යවසායවල වටිනාකම වර්ධනය කළ හැකි කළමනාකරුවන් පිරිසක් බිහි කිරීම ය.

## පහසුකම් වැඩි දියුණු කරවීම

ශිෂ්‍යයන් සඳහා වඩාත් සතුටුදායක පහසුකම් සැපයීමේ අරමුණින් මෙ ම වසරෙහි දී පහත දැක්වෙන නව පහසුකම් හඳුන්වා දෙන ලදි.

- ශාරීරික යෝග්‍යතා පුහුණු-මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම -

  ශාරීරික යෝග්‍යතා පුහුණු-මධ්‍යස්ථානය ඉතා වැදගත් වන කාර්ය-ජීවිතය හා ඉගෙනීම අතර තිබිය යුතු සමතුලිතතාව ඇති කර ගැනීමට එම්.බී.ඒ වැඩසටහන් හදාරන සැලකිය යුතු ශිෂ්‍ය කළමනාකරුවන් සංඛ්‍යාවකට හැකියාවක් නොපවතී. ජීවිතය හා බැඳුණු සිව්-මුහුණත වන ශාරීරික-මානසික-සමාජයීය හා ආධ්‍යාත්මික පැතිකඩ හසුරුවා ගැනීමේ කේන්ද්‍රීය වැදගත්කම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ශිෂ්‍ය කළමනාකරුවන් අගය කළ යුතු බව අපේක්ෂා කෙරේ. මෙ ම අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීමට උක්ත මධ්‍යස්ථානය උපකාරී වේ.

  මේ සඳහා අලුත් ආම්පන්න සපයා ශාරීරික යෝග්‍යතා පුහුණු-මධ්‍යස්ථානය වැඩි දියුණු කොට තැබීම මධ්‍යම රාත්‍රී 12.00 වන තෙක් දීර්ඝ කරන ලදි.

- වෙබ් පදනමින් ශිෂ්‍ය-ප්‍රගතිය වාර්තා කිරීමේ ක්‍රමවේදය: (Web-based Student Progress Reporting System) - මෙ ම ක්‍රමවේදය සකසන ලද්දේ එම්.බී.ඒ පාඨමාලාව හදාරන කාලපරිච්ඡේදය තුළ දී ශිෂ්‍යයනයට

සිය අධ්‍යාපන ක්‍රියාකාරිත්වය යාවත් කාලීනව වෙබ් අඩවිය ඔස්සේ බලා ගැනීම සඳහා ය. එක් එක් විෂය වෙනුවෙන් උපයා ගත් ලකුණු, පාඨමාලාවල ලකුණුවල සාමාන්‍ය, අදාළ ශිෂ්‍ය කණ්ඩායමෙහි තම-තමන්ගේ තත්ත්වය, වැනි කරුණු මින් ශිෂ්‍යයනට බලා ගත හැකි ය.

මෙ ම ක්‍රමවේදය, නව අංග හඳුන්වා දෙමින් වර්ෂය තුළදී තව දුරටත් වැඩි දියුණු කරන ලදි.

- කාර්යාලයීය වේලාවෙන් පසුව සවස දේශනවලට සහභාගි වන ශිෂ්‍ය-කළමණාකරුවන්ගේ පහසුව සඳහා වාහන වැඩි සංඛ්‍යාවක් රඳවා තැබිය හැකි වන අයුරින් රථ-වාහන ගාල විශාල කරන ලදි.

- දේශන ශාලා ද, වෙසෙසින් ම ආචාර්ය මණ්ඩලයේ කාමර පහසුකම්ද වැඩි දියුණු කරන ලද අතර, ශිෂ්‍ය අධ්‍යයන ප්‍රදේශවලට හා දේශන ශාලා දෙකකට අලුත් පුටු හා මේස සපයන ලදි.

- දේශන ශාලාවල පරණ ශබ්ද-විකාශන පද්ධතිය වෙනුවට, අලුත් අංග සහිත නව ශබ්ද-විකාශන පද්ධති ස්ථාපිත කරන ලදි.

- ගොඩනැගිල්ල සුණු පිරියම් කරන ලද අතර නඩත්තු කටයුතු නොකඩවාම සිදු කරන ලදි.

- ශිෂ්‍ය-අධ්‍යයන-වෙබ් අඩවිය ඔස්සේ දෛනික පැමිණීමේ සටහන් බලා ගැනීමට පහසු වන අයුරින් ලේඛනගත කරන ලද ශිෂ්‍ය පැමිණීමේ සටහන් වෙනුවට හඳුන්වා දුන් ස්වයංක්‍රීය බාර් සංකේත පද්ධතිය තව දුරටත් වැඩි දියුණු කරන ලදි.

- පරිගණක හා අන්තර්ජාල ඔස්සේ ශිෂ්‍යයන් විසින් ආචාර්ය මණ්ඩලය ඇගැයීමේ ක්‍රමය හඳුන්වා දෙන ලද අතර, පාඨමාලා හා සම්බන්ධිත පත්‍රිකා හා ශිෂ්‍යයන් විසින් උපයා ගත් පරීක්ෂණ ලකුණු පරිගණක හා අන්තර්ජාලය තුළින් යාවත්කාලීන කිරීම මෙම අවුරුද්දේදී ද ඉදිරියට ගෙන යන ලදි.

- හදිසි–වැදගත් කරුණු සම්භන්ධයෙන් ශිෂ්‍යයන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අධි-ධාරිතාවෙකින් යුතු කෙටි පණිවුඩ සේවා ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු යොදන ලදි.

## කළමනාකරණ පුහුණුව හා උපදේශන සේවා

2011 වසරේ දී, මෙතෙක් ක්‍රියාත්මක නොකරන ලද ප්‍රමාණයේ විධායක ප්‍රවර්ධන වැඩ සටහන් සංඛ්‍යාවක් පවත්වන ලදි.

| | ආයතනය | වැඩ සටහන |
|---|---|---|
| 01 | සීමාසහිත සිටිසන් ඩිවෙලොප්මන්ට් මූල්‍ය සමාගම | බැංකුවේ මධ්‍ය-කළමනාකරුවන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන පුහුණු වැඩ සටහන |
| 02 | ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරය | විධායක නිලධරයන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන පුහුණු වැඩ සටහන |
| 03 | මිලේනියම් අයිටී | උසස් කළමනාකරණ සහතික වැඩ සටහන |
| 04 | හැටන් නැෂනල් බැංකුව | ශාඛා කළමනාකරුවන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන පුහුණු වැඩ සටහන |
| 05 | ඩොයිෂ් බැංකුව | වෙළෙඳ කාර්යමණ්ඩලය සඳහා වැඩ මුළුව |
| 06 | ජාතික ප්‍රවාහන කොමිසම | කාර්යමණ්ඩල ප්‍රවර්ධන පුහුණු වැඩ සටහන |

## පාඨමාලා සැලැසුම් හා (සැපැයුම) නිකුතුව

පාඨමාලා හදාරන ශිෂ්‍යයනට වටිනාකමක් ලබා දෙමින් තරගකාරිත්වයෙහි ඉහළින් රැඳී සිටීම සඳහා එම්.බී.ඒ වැඩසටහන්වල යෝග්‍යතාව වැඩි දියුණු කිරීමට නව්‍ය-ප්‍රයත්නවල නියැලිණි. මෙ ම වසරේ දී පහත දැක්වෙන වෙනස්කම් සිදු කෙරිණි.

- **පාඨමාලා ආකෘති (Course Outline)**

  අන්තර්ගතයෙහි තීව්‍රතාව ද පැහැදිලි දිශාව ද සපයනු සඳහා පාඨමාලා ආකෘති යළි සකසන ලදි. පූර්ණ, එ මෙන් ම මනාව සැලැසුම්කරන ලද පාඨමාලා ආකෘති හා සමඟ ම අනිවාර්යයෙන් කියවිය යුතු දෑ ලැයිස්තුගත කිරීමෙන් (I) පාඨමාලා සූදානම් කිරීමෙන් හා දැනුම නිකුතුවෙන් දේශකයනට ද (II) යම් සැසියක් සඳහා ශිෂ්‍ය-කළමනාකරුවණට කල්වේලා ඇතිව සූදානම් වීමට ද උපකාරී වී ඇත.

- **<u>නිකුතු-මාධ්‍ය (Delivery mode)</u>**

  මෙහිලා පැහැදිලි වෙනස්කම් දෙකක් සිදුකරන ලදි. පැය තුනක සැසියක් තුළ දී එක් කොටසක දී පමණක් නියම ලෙසින් ම දේශනය සඳහා යොදවා ගත යුතු ව පවතී. එ නම් පැවසුම (Tell) ය. සැසියේ ඉතිරි කාලය දැක්වීමටත් (උදා : වීඩියෝ) ඇසීමට හෙවත් සංවාදයට (Ask) එනම් සාකච්ඡාව හා සංවාදයටත්, කිරීමට (Do) හෙවත් අභ්‍යාස හා විශයානුබද්ධ අධ්‍යයන සඳහාත් යෙදවිය යුතුව පවතී. ශිෂ්‍ය කළමනාකරුවනට ධනාත්මක බලපෑමක් ඇති කරවමින් අපේක්ෂිත ඉගැන්වීම් ප්‍රතිඵල ලබා ගැනීමට නිකුතුව (Delivery) සඳහා මෙ ම මාධ්‍ය හතර ම උපයෝගී කොට ගැනීමේ අවශ්‍යතාව ආචාර්ය මණ්ඩලය අවබෝධ කොට ගෙන සිටිති.

- **<u>ආගන්තුක දේශන (Guest Lectures)</u>**

  විශේෂිත මාතෘකා මත ආගන්තුක දේශන පැවැත්වීමට කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නියුක්ත වූ ප්‍රමුඛ පුද්ගලයන් බෙහෙවින් අන්යුක්ත කර ගනිමින් පවතී. මෙ ම සැසි පූර්ව-සැලැසුම් කරන ලද ඒවා වන අතර, පාඨමාලා ආකෘතිවලට ද ඇතුළත් කොට ඇත. මෙ ම ආගන්තුක දෙශකයන්ගේ ඉදිරිපත්වීම වැඩදායක වී ඇති අතර, ඇත්ත වශයෙන් ම මෙ ම ක්‍රියා මාර්ගය අපගේ එම්.බී.ඒ වැඩසටහන් හා අපගේ තරඟකරුවන්ගේ වැඩසටහන් අතර වැදගත් වෙනස්කමක් නිර්මාණය කරයි.

- **<u>ලකුණු නිකුත් කිරීම (Release of Marks)</u>**

  නියමිත වේලාවෙහි දී ලකුණු නිකුත් කිරීම සඳහා ආචාර්ය මණ්ඩලයට නිශ්චිත කාල රාමු ලබා දී ඇත. එනම් අවසාන පරීක්ෂණය පවත්වන දිනයේ සිට දින 28ක් ඇතුළත දී ය. මේ පිළිබඳ ව සමීප අවධානයක් රඳවා ඇති අතර මෙ ම කරුණ ආචාර්ය මණ්ඩලයේ වැදගත් ඵලදායිතා දර්ශකයක් වෙයි.

- **<u>ශිෂ්‍ය- ඇගැයීම් (Student Evaluation)</u>**

  පාඨමාලාවක් පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ ආකල්පය නිරීක්ෂණය කිරීමට ශිෂ්‍ය-ඇගැයීම වැදගත් වෙයි. වාර අවසානයේ දී එක් එක් ශිෂ්‍යයා විසින් සිදු කෙරෙන ඇගැයීම සම්පිණ්ඩනය කෙරෙන අතර ශිෂ්‍ය කළමනාකරුවන්ගේ දෘෂ්ටිය අනුව ආචාර්ය මණ්ඩල -සාමාජිකයන්ගේ කාර්ය ඵල දක්වනු ලැබේ. ආචාර්ය මණ්ඩලයේ තවත් එක් වැදගත් ඵලදායිතා දර්ශකයක් ලෙසින් 1 සිට 5 දක්වා වූ මිනුම් දණ්ඩක පොදු ඇගැයීම් 4 දර්ශකයක් සෑම ආචාර්ය මණ්ඩල සාමාජිකයකු ගෙන් ම අපේක්ෂා කෙරේ.

උක්ත ඵලදායිතා දර්ශක ඒකාබද්ධ කිරීමෙන් ආචාර්ය මණ්ඩලය සඳහා 4x4x3 ක සූත්‍රය සැකසේ.

4= නිකුතු-මාධ්‍ය හතරේ මුසුව

4= දර්ශක 5 අතුරින් 4 මට්ටමේ ශිෂ්‍ය-ඇගැයීම

3= පරීක්ෂණ දිනයේ සිට සති 3ක් තුළ දී අවසන් ලකුණු නිකුත් කිරීම

වැඩසටහන් සම්පාදනයේ වැදගත් ලක්ෂණයක් නම් නේවාසික වැඩමුළුව යි. සාමාන්‍යයෙන් මෙ ම වැඩමුළු නාගරික පරිසරයෙන් ඈත් ව හෝටල්වල පැවැත්වෙන අතර, මෙ ම වසරේ දී එ වැනි වැඩමුළු දෙකක් පැවැත් වුණි. කණ්ඩායම් පරිසරයක නිර්මාණය වර්ධනය කෙරෙන, ලිහිල් පරිසරයක තෝරා ගත් ගැටළු පරීක්ෂා කිරීමට ශිෂ්‍යයනට ද ආචාර්ය මණ්ඩලයට ද මෙ ම වැඩමුළු උපකාරී වේ.

## වාර්ෂික ආචාර්ය මණ්ඩල වැඩ මුළුව

මහනුවර, ට්‍රී-ඔෆ්-ලයිෆ් හෝටලයෙහි දී, 2011 ඔක්තෝම්බර් මස 15/16 දෙ දින තුළ දී, ආයතනයේ වාර්ෂික ආචාර්ය මණ්ඩල වැඩ මුළුව පවත්වන ලදි.

මෙ ම වැඩ මුළුවෙහි මුඛ්‍ය අරමුණ වනුයේ වර්තමාන හා අනාගත අවශ්‍යතා සාක්ෂාත් කර ගනිමින් කටයුතු වඩාත් සාර්ථක කර ගැනීමේ අරමුණින් ආයතනය නිසි තැන පිහිටුවමින් ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කරවීම සඳහා ආයතනයේ වැදගත් කර්තව්‍ය හා ක්‍රියාකාරීත්වය පිළිබඳව සමාලෝචනය කිරීමයි. ඇත්ත වශයෙන්ම වඩා ඵලදායී ආචාර්ය මණ්ඩල වැඩ මුළුවෙකින් විද්වත් සමාජයට නව ජීවයක් ලබා දිය හැකි යි. එමෙන් ම මනාව සංවිධානය කැරුණු වැඩ මුළුවෙක ව්‍යුහයකින් හා අන්තර්ගතයෙකින් ආයතනයේ අනන්‍යතාව වර්ධනය කර ගැනීමට උපකාරී වන අතර, ආයතනය පිළිබඳව සාමූහික පිළිබිඹුවක් මෙන් ම එහි ඉදිරි ගමන කෙරෙහි ප්‍රබෝධයක් ඇති කරවිය හැකි යි. ආචාර්ය මණ්ඩල වැඩ මුළුවේ අපේක්ෂාව මෙය වේ.

## සංවර්ධනය සඳහා 5M - රාමුව

ඉදිරි වසරවල දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ඉදිරියට රැගෙන යනු සඳහා පංච-මාන (Five Dimensional) වැඩ සටහනක් යොදා ගන්නා ලදි. මෙ ම 5M වැඩ සටහනින් විස්තර කෙරෙනුයේ Market (වෙළෙඳ පොළ) Member (ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලය) Mentors (පසු විපරම් හා උපදේශකත්වය සඳහා පත්කරන ලද ආචාර්යවරුන්) Monitors (එක් එක් ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා පත්කරන ලද පන්ති නායකයන් හා එම්.බී.ඒ උපාධිධරයන්ගේ සංගමයයි. (Alumni)

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට ISO 9001:2008 තත්ත්වය ලබා ගැනීම

ආයතනයට ISO 9001:2008 තත්ත්වය ලබා ගැනීමට කටයුතු අරඹන ලදි. ISO අවශ්‍යතාවල මූලික කරුණු සපුරාලීම සඳහා කාර්යමණ්ඩලය අනුයුක්ත වූ හ.

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැඟිලි ව්‍යාපෘතියේ II වන අදියර

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැඟිල්ලෙහි II වන අදියර ඉදි කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකසා, අනුමැතිය ලබා ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමට ඉදිරිපත් කෙරිණි. ව්‍යාපෘතියේ පූර්ණ ඇස්තමේන්තුගත වියදම රුපියල් දස ලක්ෂ 171කි. 2012 වසරේ දී ව්‍යාපෘතියේ කටයුතු ඇරැඹීමට බලාපොරොත්තු වන අතර, ගොඩනැඟිල්ලේ සැලැකිය යුතු ප්‍රමාණයක් නිම කර ගැනීමට ආයතනය විසින් උපදවාගනු ලබන අරමුදල යොදා ගනු ලැබේ.

## පශ්චාත් උපාධි සම්පූර්ණ කිරීම්

මෙ ම වසරෙහි දී විද්‍යාපති උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව මෙසේ ය.

| | | |
|---|---|---|
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන ශූරී උපාධිය | - | 01 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | - | 327 |
| මූල්‍ය හා බැංකුකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | - | 02 |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | - | 42 |
| රේගු පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | - | 60 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | - | 01 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - | 01 |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - | 03 |
| මූල්‍ය හා බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - | 01 |
| **මුළු උපාධිධරයන් සංඛ්‍යාව** | - | **438** |

2011 ජූලි මස 23 වැනි දා පැවැත්වුණු විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රධානෝත්සවයෙහි දී මෙ ම උපාධි අපේක්ෂකයනට පශ්චාත් උපාධි පිරිනමන ලදි.

## ප්‍රචාරණය හා ආයතනයේ ප්‍රතිරූපය

2011 වසරෙහි දී ආයතනයේ සියලු ක්‍රියාකාරීත්වයන් හා වැදගත් සිදුවීම් ප්‍රචාරණය කිරීමට විශේෂිත ප්‍රයත්නයක් දරන ලදි. පුවත් පත් හා රූපවාහිනිය ඔස්සේ සියලු ම ක්‍රියාකාරකම් හා වැදගත් සිදුවීම් පුළුල් ලෙස ප්‍රචාරණය කරන ලද අතර ඉන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ දෘෂ්‍යභාවය වර්ධනය විය. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියෙන්ද, එහි පැවැති විශේෂ අවස්ථා ආවරණය කෙරිණි.

## පර්යේෂණ ප්‍රකාශන සහ පුස්තකාලය

ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ විෂයයෙහි පර්යේෂණ දැනට පවතිනුයේ මූලික අවධියෙක ය. මෙ ම විෂය පිළිබඳ පර්යේෂණ සම්ප්‍රදායක් අප කෙරෙන් මේ දක්වාම වර්ධනය වී නොමැත. මෙහි ලා පවතින සැබෑ අභියෝගය නම් අපගේ ප්‍රධාන පර්යේෂණ ප්‍රයත්න සංවිධානය කොට වර්ධනය කිරීමට අවශ්‍ය වන දර්ශන-පදනමක් සොයා ගැනීම යි.

පර්යේෂණයේ (හා සොයාගැනීම් ප්‍රකාශනයෙහි) ප්‍රධාන අරමුණ නම් විද්‍යාවක් මෙන් ම වෘත්තියක් වශයෙන් කළමනාකරණ විෂය පෝෂණය කිරීමට අවශ්‍ය වන දේශීය කළමනාකරණ අන්තර්ගතය සොයා ගැනීම යි. ගෞරවනීය මට්ටම් වෙත පර්යේෂණවල තත්ත්වයන් ඔසවාලීම සඳහා ක්‍රම හා ප්‍රවේශ නඟා සිටුවීමට අපි සුදුසු මාර්ගය සොයමු. ශ්‍රී ලංකික සන්දර්භයත් සමාජයට වැදගත් වන පරිදි දැනුම හසුරවාලීමත් අතර පවත්නා මහත් හිඩැස් වෙත කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ අරමුණු යොමු වී පවතී.

ප්‍රකාශනයත් සංවාදයත් සඳහා දිගින් දිගටම පදනමක් සැපැයීමට 1996 දී අරඹන ලද ආයතනයේ තෛමාසික ප්‍රකාශනය වන ශ්‍රී ලන්කන් ජර්නල් ඔෆ් මැනේජ්මන්ට් (Sri Lankan Journal of Management) විශාල වශයෙන් අවකාශ ලබා දෙයි. 2011 වසරේදී මෙ ම ප්‍රකාශනයෙහි අධි-ප්‍රමාණයේ වෙළුම් තුනක් ප්‍රකාශයට පත් කරන ලදි. මෙ ම ප්‍රකාශනයෙහි මූලික අරමුණ නම් කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු, ප්‍රයෝග විධි හා වර්ධනයන් පිළිබඳව ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ක්‍රියා කරමින් උක්ත ක්ෂේත්‍රවල පර්යේෂණ හා අධ්‍යයන ප්‍රතිඵල ව්‍යාප්ත කිරීම යි. කළමනාකරණ ක්ෂේත්‍රයට සම්බන්ධිත කෘති විද්‍යාර්ථීන් හා වෘත්තිකයන් විසින් පළ කරවීමට මෙම සංග්‍රහය විවෘත ව පවතී.

වර්තමාන කළමනාකරුවන්ගේ නැඟී එන අවශ්‍යතා සපුරාලීමට මෙම ප්‍රකාශන සංග්‍රහයට අමතර ව අර්ධ වාර්ෂික "වෘත්තීය කළමනාකරු (Professional Manager)" සඟරාව ද මෙ ම වසරේදී ප්‍රකාශයට පත් කරන ලදි. වෙළෙඳ පොළට මෙම සඟරාව හඳුන්වා දීමේ පරමාර්ථය වූයේ කියවා තේරුම් ගැනමට පහසු ශෛලියකින් වැදගත් කළමනාකරණ දැනුම ව්‍යාප්ත කරවීමයි. යම් විශේෂිත විෂය නැඹුරුවක් මෙහි නොමැති වන අතර, සංකීර්ණ හා කැළැඹුණු පරිසරයක සිය කටයුතු මෙහෙයවන වත්මන් කළමනාකරුවන් හට වැදගත් වන, එ මෙන් ම කාලෝචිත ගැටළු මෙ ම සඟරාවෙන් ආමන්ත්‍රණය කෙරේ.

කියැවීමට පහසු එ මෙන් ම අන්තර්ගතයෙන් පොහොසත් ලිපි සංග්‍රහයක් තුන්වැනි කලාපයට ඇතුළත් විය.

වීඩියෝ පුස්තකාලය (Video Library) ඇතුළුව, පුස්තකාලයෙහි ව්‍යාප්තිය 2011 වසරේ දී ද දිගට ම කරගෙන යන ලදි. මෙ ම ව්‍යාපෘති කටයුතු සැලැස්ම සඳහා රුපියල් මිලියන 2ක මුදලක් වෙන් කරන ලදි.

පාඨකයන් වැඩි පිරිසක් සඳහා පහසුකම් සැපැයීමට පුස්තකාලය තවදුරටත් වැඩි දියුණු කරන ලද අතර, පාඨක පහසුව සඳහා පහතින් දැක්වෙන පහසුකම් සපයන ලදි.

- පර්යේෂණ එකතුව හා තොරතුරු ලබා ගැනීමට සහාය වීම
- අන්තර්-පුස්තකාල හුවමාරුව
- විෂය අනුව කෘති නාමාවලිය සැකැසීම හා ප්‍රදර්ශනය කිරීම
- අන්තර්ජාල සම්බන්ධතා හා වීඩියෝ
- ස්වයංක්‍රීය ග්‍රන්ථ නාමාවලිය

2011 වසර අවසානයෙහි දී කළමනාකරණය හා ඊට සම්බන්ධිත ක්ෂේත්‍රවලට අදාළ පොත් 30,000 ට වැඩි සංඛ්‍යාවක් ද සඟරා හා වාරික සංග්‍රහ 60 ක් ද පාඨකයන් වෙනුවෙන් සපයන ලදි.

පුස්තකාල සේවාව කාර්යක්ෂම කිරීම සඳහා පුස්තකාලය නවීකරණ වැඩ සටහනෙහි කොටසක් වශයෙන් තීරු සංකේත සංසරණ ක්‍රමයක් ( Bar coded Circulation System) හඳුන්වා දෙන ලදි.

## පී.අයි.එම් ඉදිරිපත් කිරීම් නිර්ණායක (PIM Presentation Guideline)

ආයතනයේ අධ්‍යයන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වාර්තාවලට අදාළවන ඉදිරිපත් කිරීම් සඳහා සම්මතයක් ඇතිකරලීමේ අටියෙන්, "කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ඉදිරිපත් කිරීම් නිර්ණායක" නමින් යුතු අත්-පොතක් සකසන ලදි. පිළිගත් අධ්‍යයන කේන්ද්‍රවල නිර්ණායක ද වෙසෙසින් 'American Psychological Association' සංගමයෙන් ප්‍රකාශිත නිර්ණායක ද, එ මෙන් ම, ආචාර්ය මණ්ඩලයේ නිර්දේශ ද පදනම් කොට ගෙන සකසන ලද සම්මත මෙ ම අත්පොතෙහි ඇතුළත් වේ.

## ව්‍යාපාරික හා වෙළෙඳ පොළ සබඳතා සහ කළමනාකරණ වර්ධන පුහුණුව

ප්‍රතිපත්තියක් ලෙසින්, කළමනාකරණ උපදේශන සේවා කාර්ය ආයතනය විසින් භාරගනු ලැබේ. බොහෝ විට ප්‍රායෝගික කළමනාකරණ ගැටලුවලට මුහුණ දීමෙන් මෙ ම උපදේශන සේවා කාර්ය මඟින් ආචාර්ය මණ්ඩලයේ විෂය කරුණු හා නිපුණතා වැඩි දියුණු කර ගැනීමට උපකාරී වේ. සමාගම් සැලසුම්කරණය සංවිධානය ප්‍රතිව්‍යුහගත කිරීම, කාර්ය විශ්ලේෂණය, වේතන වැටුප් පිළිවෙත්, පුහුණුව හා වර්ධනය හා ආයතනික වර්ධනය වැනි ක්ෂේත්‍ර හා සම්බන්ධිත කළමනාකරණ උපදේශක සේවා කිහිපයක් ම 2011 වසරේ දී සාර්ථකව නිම කිරීමට හැකි විය.

ව්‍යාපාරික ප්‍රජාවගේ ක්‍රියාශීලී සහායකයකු වීම සඳහා යත්න දැරේමේ අරමුණින් මෙ ම ආයතනය නියුක්ත වන තවත් එක් කාර්යෙකි පාරිභෝගිකයන් කේන්ද්‍ර කොට ගත් සේවක පුහුණුව. මෙ ම පාරිභෝගිකයනට නිෂ්පාදනය, සේවා සැපැයීම, බැංකු මූල්‍ය හා රක්ෂණ කටයුතු හා විශේෂ සේවා වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශවලට අයත් අංග ඇතුළත් වේ. මෙ ම වසර තුළ දී මෙ වැනි පුළුල් පැතිකඩකට අයත් වැඩමුළු හා පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

## කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වන කළමනාකරණ මණ්ඩලය, පහතින් දැක්වෙන සාමාජිකයන්ගෙන් නියෝජනය විය.

මහාචාර්ය උදිත ලියනගේ මහතා, අධ්‍යක්‍ෂ සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති
ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (නියෝජනය - පියසේන රණේපුර මහතා)
ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය (නියෝජනය - ඩබ්. එම්.පී.ජී. වික්‍රමසිංහ මහතා)
ලේකම්, මුදල් අමාත්‍යාංශය (නියෝජනය - ආචාර්ය ඩී. එම්. එස්. බටගොඩ මහතා)
අධ්‍යක්‍ෂ ජනරාල්, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (ආචාර්ය ඊ. ඒ. වීරසිංහ මහතා)
සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සුජීව මුදලිගේ මහතා)
සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (ආචාර්ය ඒ. කේ. ඩබ්. ජයවර්ධන මහතා)
සභාපති, ශ්‍රී ලංකා වානිජ සංගමය (ආචාර්ය අනුර ඒකනායක මහතා)
පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වානිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය (මහාචාර්ය සම්පත් අමරතුංග මහතා)
අධ්‍යක්‍ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (බී. විජයරත්න මහතා)
මහාචාර්ය අබේරත්න බණ්ඩාර මහතා, මූල්‍ය අධ්‍යාපනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය එච්. එච්. ඩී. එන්. පී. ඕපාත මහතා, මානව සම්පත් අධ්‍යාපනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය ඩී. ඒ. තන්තිරිගොඩ මහතා, භෞතික විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය එම්. එල්. ඒ. කාදර් මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයය
එම්. එන්. ජුනේඩ් මහතා, සම-සභාපති, ජාතික වැටුප් කොමිෂන් සභාව
ගාමිණී මුණසිංහ මහතා, අධ්‍යක්‍ෂ, පරිසර සම්පත් ආයෝජන පෞද්ගලික සමාගම
ආචාර්ය දේවප්‍රිය නුගවෙල මහතා, සභාපති, ලින්ක් නැචුරල් නිෂ්පාදන සමාගම
ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ශ්‍රී ලංකා රක්‍ෂණ කටයුතු පිළිබඳ "ඔම්බුඩ්ස්මන්" වරයා

## අධ්‍යයන මණ්ඩලය

උක්ත වර්ෂය තුළ අධ්‍යයන මණ්ඩලය නියෝජනය කරන ලද්දේ පහතින් සඳහන් ලද සාමාජික මහතුන් විසිනි.

## ව්‍යාපාර පරිපාලන අධ්‍යයන මණ්ඩලය

මහාචාර්ය උදිත ලියනගේ මහතා, අධ්‍යක්‍ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ආචාර්ය සම්පත් අමරතුංග මහතා, පීඨාධිපති, කළමනාකරණ හා වානිජ අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය ඩේවිඩ් එවන්ස් මහතා, ආගන්තුක මහාචාර්ය

අර්ඩ්ලි පෙරේරා මහතා, සභාපති, සීමාසහිත එම්. ඇන්ඩ්. ඊ (පෞද්ගලික) සමාගම
ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ජ්‍යෙෂ්ට උපදේශක
ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ශ්‍රී ලංකා රක්‍ෂණ ආයතන "ඔම්බුඩ්ස්මන්" වරයා
ආචාර්ය ජී. සී. බී විජේසිංහ මහතා, වරලත් ගණකාධිකාරී

## රාජ්‍ය පරිපාලන අධ්‍යයන මණ්ඩලය

මහාචාර්ය උදිත ලියනගේ මහතා, අධ්‍යක්‍ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ආචාර්ය එච්. එම්. ඒ. හේරත් මහතා, රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය එස්. ඩබ්. රණසිංහ මහතා, පීඨාධිපති, මානව හා සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයය
ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු මහතා, වැඩසටහන් අධ්‍යක්‍ෂ, රාජ්‍ය පරිපාලන ව්‍යාපෘති පාඨමාලාව
ලලිත් වීරතුංග මහතා, ගරු ජනාධිපතිතුමන්ගේ ලේකම්
ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා, ජනාධිපති නීතීඥ
මහාචාර්ය එම්. ඩබ්. වික්‍රමාරච්චි මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය

මෙම වසර තුළ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය මෙහෙයවන ලද්දේ 2009-2011 ආයතනික සැලැසුම පදනම් කරගෙන, කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය විසිනි. මුඛ්‍ය ක්ෂේත්‍රවන පර්යේෂණ, උපාධි-අධ්‍යාපනය, පුහුණු හා උපදේශන සේවා, නව අධ්‍යාපන ව්‍යාපෘති හා ආයතනයේ ස්ව-මූල්‍ය උත්පාදනය සඳහා වන ආදායම් උත්පාදනය දිරිගන්වන සුලු විය.

## ශිෂ්‍ය බඳවා ගැනීම

| පාඨමාලා | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 201 |
| ජාත්‍යන්තර වෙළෙඳාම හා ක්‍රමවේද පිළිබඳ විද්‍යාපති උපාධිය | 38 |
| **එකතුව** | **239** |

ඉහතින් සඳහන් ලද අධ්‍යයන පාඨමාලා මෙ ම වර්ෂය තුළ දී මෙහෙයවන ලද අතර, එ ම පාඨමාලාවල වැඩ සටහන්-පරිපාටි, වර්ධනය වන ප්‍රවනතා හා දැනුම් අනුයමින් වැඩි දියුණු කරන ලදි.

## ආචාර්ය මණ්ඩලයේ සම්පත් දායකයෝ

මෙහි පහතින් දැක්වෙන ආචාර්ය මණ්ඩලය 2011 වසරේදී ආයතනයට සිය සේවාව ලබා දුන්හ. මෙම කණ්ඩායම ස්ථිර කොන්ත්‍රාත් බාහිර විද්‍යාර්ථී හා වෘත්තීය පදනම්වලට අයත් වෙති.

## පූර්ණ කාලීන ආචාර්ය මණ්ඩලය

මහාචාර්ය උදිත ලියනගේ මහතා

Dip.M, FCIM, MBA (PIM-USJ), Ph.D. (Sri J.) PIMහි අධ්‍යක්ෂ

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා

MIED (UK), MBA (PIM-USJ), Ph.D. (Sri J.) Senior Consultant

ආචාර්ය ඒ. කේ. එල්. ජයවර්ධන මහතා

B Tech (Mad.), MBA (PIM-USJ), Ph.D. (Canb.) Senior Consultant

ආචාර්ය අජන්ත එස්. ධර්මසිරි මහතා

B Sc.Eng (Moratuwa), MBA (PIM-USJ), Ph.D. (Sri J.) Consultant

එස්. අතුරලියගේ මහතා

B Sc.Phy.Sc. (Ruhuna), M Sc Comp, Sc (Col.) Consultant

මහාචාර්ය තිලක් ෆොන්සේකා මහතා

BA. (Cey.). L.L.B (Col.), MBA (PIM-USJ), MA (Col.), Ph.D. (Sri J.) Att-at-Law

මහාචාර්ය එස්. ඩබ්. රණසිංහ මහතා

BAP (Vid.), MPA (PIM-USJ), Ph.D. (Sri J.)

ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා

L.L.B. (Pera.), Ph.D. (London) Att-at-Law

ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු මහතා

M Sc. (Moscow), Ph.D. (Sussex)

කාල්ටන් සමරජීව මහතා

BA. (Cey.), B. Ed (Queens), Dip.Ed. (Lond.), Dip.TEFL

මහාචාර්ය මංගල ෆොන්සේකා මහතා

B Sc, MBA (Col.), FCMA (UK)

වෙලිංටන් පියදාස මහතා

FCMA, FPFA, P.G.Dip.M.P. (UCD), P.G.Dip.SCF (ICASL), MBA(UCD)

එන්. නිර්මලන් මහතා

MDMI (USQ), B Sc (Hons) Comp & IS (LGU), MCS (SL)

හර්ෂ ප්‍රනාන්දු මහතා

LLM (Lond.), MBA (Nanyang), Att-at-Law

කේ. ඒ. අයි. කල්‍යාණරත්න මහතා

BA (Cey.), MBA/HRM (PIM-USJ), ACIT (UK)

මහාචාර්ය ඩේවිඩ් එවන්ස් මහතා

BA (Hons.), M Sc, Dip.Edu.

මාරියෝ ෆොන්සේකා මහතා

MCIM (UK), FSCMA, MBA (PIM-USJ)

ආචාර්ය පෙනිලොපි හුඩ් මිය

DMS (Ed), M Sc. (Edu.Mgt.) Ph D. (Anglia)

මෆාස් ඉෂාක් මහතා

B Sc. (Eng.), M Sc. (Econ) M Sc.(Eng), CISA

අජන්ත මදුරප්පෙරුම මහතා

AIB (SL), FCMA (UK), CFA, MBA (PIM-USJ)

ආචාර්ය ට්‍රෙසි කාටර් මිය

B Sc. (Wright State), MBA, Ph D. (Georgia)

සංජීව් ජයරත්නම් මහතා

C.Eng.MBCS, B Sc.(Manchester), MBA (PIM-USJ)

තිස්ස ජයතිලක මහතා

BA (Cey), MA (Wake), MPA (Sri J.)

ආචාර්ය සතිෂ් ශින්ඩෙ මහතා

M Sc. MBA, Ph D. (Pune)

සේනක වීරසූරිය මහතා

B Sc. (ANU), MIT (Canberra)

සුනිල් විජේසිංහ මහතා

FCMA, C.Eng. MBA (PIM-USJ)

රවී එදිරිසිංහ මහතා

MBA (PIM-USJ), ACMA (UK), FSCMA

ආචාර්ය අරුල් සිවගනනාදන් මහතා

B.Eng. (Hons) (London), AMIE (SL), FCMA (UK), MBA (Cranfield), Ph D. (USA)

පාඨමාලා මෙහෙයවීමේ ද දර්ශනපති හා විද්‍යාපති උපාධි ශිෂ්‍යයන්ගේ පර්යේෂණ නිබන්ධන හා නිපුණතා ව්‍යාපෘති ආදීක්ෂණයෙහිදී ද අධ්‍යයන කාර්ය මණ්ඩලය නියුක්තව සිටිති.

පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා සහතික පත්‍ර වැඩසටහන්වලට සම්බන්ධිත කටයුතුවල සාර්ථකත්වය හ ඳුනා ගන්නා ලද්දේ තත්ත්ව ප්‍රමිති අදාළත්වය සාර්ථක පාඨමාලා අවසන් කරන ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව පදනම් කරගෙන යි.

අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය නිරීක්ෂණය කරන ලද්දේ ක්‍රම කිහිපයක් මඟිනි. පළමුව එක් එක් අධ්‍යයන වැඩසටහනෙහි හිමි වන කුසලතා සම්මාන අධ්‍යාපනයේ ප්‍රගතිය දක්වනු ලබන බවට අපේක්ෂා කෙරේ. 2010 වසරේ දී ලද 10% කුසලතා සම්මාන ප්‍රමාණය 2011 වසරේ දී 12% දක්වා වැඩි කිරීමට අධ්‍යයන කාර්ය මණ්ඩලය විශේෂ ප්‍රයත්නයෙක යෙදුනහ.

මෙම ඉලක්ක වෙසෙසින්ම ඇති කරගන්නා ලද්දේ පසුව පත් කරන ලද ශිෂ්‍ය පර්යේෂණ හා ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඔස්සේ ය. මෙය ගුණාත්මක බව නිරීක්ෂණය කිරීමේ තවත් එක් මිනුමක් විය.

අධ්‍යයන වැඩසටහන් කාලීනව සමාලෝචනය කිරීමට අමතරව ආයතනය වර්තමානයෙහි අනුගමනය කරන ක්‍රියාකාරකම්වල හා කළමනාකරණ පශ්චාත් උපාධි ආතනයෙහි සෑම කාර්යයෙක ම ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව විවෘතව සාකච්ඡා කිරීමට ආචාර්ය මණ්ඩලයේ වාර්ෂික වැඩ මුළු පැවැත්වේ. අභ්‍යන්තර ක්‍රම පද්ධති හා වෙසෙසින් එම්.බී.ඒ හා සමාන්තර වැඩ සටහන් හා සම්භන්ධ ක්‍රියාකාරකම් වැඩි දියුණු තත්ත්වයට පත් කිරීමට මෙම ආචාර්ය මණ්ඩල වැඩ මුළු මහෝපකාරී වන බව හෙළි වී ඇත.

## අනධ්‍යයන කාර්ය මණ්ඩලය

මෙ ම වර්ෂය තුළදී ආයතනය පූර්ණ කාලීන කාර්ය මණ්ඩලය 22 දෙනකුගෙන් සමන්විත විය. සනීපාරක්ෂක කටයුතු හා පිරිසිදු කිරීමේ ද ආරක්ෂක කටයුතු ද ආපන ශාලා පහසුකම් සැපයීම ද බාහිර ආයතන ඔස්සේ ලබා ගන්නා ලදි.

| කොට්ඨාශය / ශාඛාව | වඩා ජ්‍යෂ්ඨ කාර්ය මණ්ඩලය | ජ්‍යෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ට කාර්ය මණ්ඩලය | සුළු සේවක කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| පරිපාලන හා අධ්‍යයන කටයුතු | 01 | 02 | 04 | 04 |
| පරිගනක මධ්‍යස්ථානය | 01 | 02 | - | - |
| පුස්තකාලය | 01 | 03 | - | - |
| අධ්‍යක්ෂක කාර්යාලය | 01 | - | - | - |
| මූල්‍ය | 01 | - | 02 | - |
| එකතුව | 22 | | | |

## පර්යේෂණ, නව්‍යකරණය හා ප්‍රකාශන

| විෂයය | ප්‍රකාශිත | වානිජ්‍යකරණයට | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ). MBA ශිෂ්‍යයන්ගේ පර්යේෂණ | - | - | 260 |
| ආ). සංග්‍රහ සංඛ්‍යාව | 04 | 04 | 04 |
| ඇ). ග්‍රන්ථ සංඛ්‍යාව | 02 | 02 | 02 |
| ඈ). පුවත්පත්හි පළකරන ලිපි | 30 | දිනපතා පුවත්පත්වල පළවුණු | 30 |
| එකතුව | 36 | 06 | 296 |

ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ විෂයයෙහි පර්යේෂණ දැනට පවතිනුයේ මූලික අවධියකය. මෙ ම විෂයය පිළිබඳ ව පර්යේෂණ සම්ප්‍රදායක් අප කෙරෙන් මේ දක්වාම වර්ධනය වී නොමැත. මෙහිලා පවතින සැබෑ අභියෝගය නම් අපගේ ප්‍රධාන පර්යේෂණ ප්‍රයත්න සංවිධානය කොට වර්ධනය කිරිමට අවශ්‍ය වන දර්ශන පදනමක් සොයා ගැනීම යි. පර්යේෂණයේ (හා සොයාගැනීම් ප්‍රකාශනයෙහි) ප්‍රධාන අරමුණ නම්, විද්‍යාවක් මෙන්ම වෘත්තියක් වශයෙන් ද කළමනාකරණ විෂයය පෝෂණය කිරීමට අවශ්‍ය වන දේශීය කළමනාකරණ අන්තර්ගතය සොයා ගැනීම යි. ගෞරවනීය මට්ටම් වෙත පර්යේෂණවල තත්ත්වයන් ඔසවාලීම සඳහා ක්‍රම හා ප්‍රවේශ නඟා සිටුවීමට අපි සුදුසු මාර්ග සොයමු. ශ්‍රී ලාංකික සන්දර්භයත් දැනුම හසුරවාලීමත් අතර පවත්නා මහත් හිඩැස් වෙත කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ අරමුණු යොමු වී පවතී.

ප්‍රකාශයත් සංවාදයත් සඳහා දිගින් දිගටම පදනමක් සැපැයීමට 1996 දී අරඹන ලද ආයතනයේ තෛයිමාසික ප්‍රකාශනය වන ශ්‍රී ලන්කන් ජර්නල් ඔෆ් මැනේජ්මන්ට් (Sri Lankan Journal of Management) (SLJM) විශාල වශයෙන් අවකාශ ලබා දෙයි. මෙම ප්‍රකාශනයෙහි මූලික අරමුණ නම්, කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු ප්‍රායෝගික විධි හා වර්ධනයන් පිළිබඳ ප්‍රකාශන මාධ්‍යක් ලෙස ක්‍රියා කිරමින් උක්ත ක්ෂේත්‍රවල පර්යේෂණ හා අධ්‍යයනවල ප්‍රතිඵල ව්‍යාප්ත කිරීම යි. කළමනාකරණ ක්ෂේත්‍රයට සම්බන්ධිත කෘති විද්‍යාර්ථීන් හා වෘත්තිකයන් විසින් පළ කරවීමට මෙ ම සංග්‍රහය විවෘතව පවතී.

වර්තමාන කළමනාකරුවන්ගේ නැඟී එන අවශ්‍යතා සපුරාලීමට මෙ ම (SLJM) ප්‍රකාශන සංග්‍රහයට අමතරව අර්ධ වාර්ෂික "වෘත්තීය කළමනාකරු" (Professional Manager) සඟරාව ද මෙ ම වසරේ දී ප්‍රකාශයට පත් කරන ලදි. වෙළෙඳ පොළට මෙ ම සඟරාව

හඳුන්වා දීමේ පරමාර්ථය වූයේ කියවා තේරුම් ගැනීමට පහසු ශෛලියකින් වැදගත් කළමනාකරණ දැනුම ව්‍යාප්ත කරවීම යි. යම් විශේෂිත විෂය නැඹුරුවක් මෙහි නොමැති වන අතර සංකීර්ණ හා කැළැඹුණු පරිසරයක සිය කටයුතු මෙහෙයවන වත්මන් කළමනාකරුවන් හට වැදගත් වන එ මෙන්ම කාලෝචිත ගැටළු මෙ ම සඟරාවෙන් ආමන්ත්‍රණය කෙරේ.

## වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

| විෂයය | සහභාගි වුණු | සම්පූර්ණ කළ | ගණන |
|---|---|---|---|
| අ). සමාගම් සඳහා කළමනාකරණ සංවර්ධන හා පුහුණු වැඩ සටහන් | සියලු දෙනා ම | සම්පූර්ණ කළා | 06 |
| ආ). එම්.බී.ඒ ශිෂ්‍යයනට වැඩ මුළු | සියලු දෙනා ම | සම්පූර්ණ කළා | 04 |
| ඇ). ආචාර්ය මණ්ඩලය සඳහා වැඩ මුළුව | ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනා ම | සම්පූර්ණ කළා | 01 |
| එකතුව | | | 11 |

## ආරම්භ කරන ලද නව පාඨමාලා

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයත් ඔස්ට්‍රේලියාවේ කැන්බෙරා විශ්වවිද්‍යාලයයෙහි රේගු හා සුරාබදු අධ්‍යයනය පිළිබඳ කේන්ද්‍රයත් (CCES) ඒකාබද්ධ ව ජාත්‍යන්තර වෙළෙදාම හා ඒකාබද්ධ කාර්ය සංවිධානය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණය හා සම්බන්ධිත විද්‍යාපති පාඨමාලාව සැලසුම් කරන ලදි. සමාගම් හා පෞද්ගලික ආයතනවල නිපුණතා මට්ටම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන නූතන ආර්ථිකයෙහි ජාත්‍යන්තර වෙළෙඳාම මුඛ්‍ය ක්ෂේත්‍රයෙකි.

උක්ත ක්ෂේත්‍රයෙහි පුළුල් අවශ්‍යතා කෙරෙහි අවධානය රඳවමින් අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දීමේ අරමුණ පෙරදැරි ව ජාත්‍යන්තර වෙළෙදාමේ හා ඒකාබද්ධ කාර්ය සංවිධානයට අදාළ මූලික කරුණු පාඨමාලාවේ වැඩසටහනට ඇතුළත් වී ඇත.

මීට අමතර ව මෙ ම පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ ශිෂ්‍යයනට ක්‍රමාණුකූල ව ජාත්‍යන්තර වෙළෙදාම හා ව්‍යාපාර ඇගැයීමේ සිට කාර්ය සාධන මෙහෙයැවීම් හා සම්පාදන ජාලයට අයත් කටයුතු පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ලබා දෙනු සඳහා ය. මෙ වැනි මෙහෙයුම් හා ක්‍රියාකාරකම් ඉටු කළ යුතු නෛතික රාමුව ද මින් හෙළිදරව් කෙරෙන අතර, එ ම වැඩ කටයුතු මෙ ම වැඩසටහනෙහි පුළුල් ව විස්තර කෙරේ.

මෙම වර්ෂය තුළ දී උක්ත පාඨමාලාවට ශිෂ්‍යයන් 38 දෙනකුගෙන් යුතු කණ්ඩායමක් බඳවා ගැනිණි.

## පුනරාවර්තන වියදම්

| | 2009 (රු.) | 2010 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| අ). පුද්ගල වැටුප් හා දීමනා | 18,647,494 | 19,243,443 | 24,133,316 |
| ආ). ගමන් වියදම් | 1,099,928 | 1,681,218 | 3,115,621 |
| ඇ). සැපයුම් | 4,529,871 | 6,028,785 | 5,353,740 |
| ඈ). නඩත්තුව | 1,096,764 | 3,150,345 | 4,120,723 |
| ඉ). කොන්ත්‍රාත්තුගත සේවා | 12,066,360 | 13,625,720 | 14,572,852 |
| ඊ). සෙසු | 21,501,812 | 24,304,280 | 18,588,791 |
| උ). ව්‍යාපෘතිවලට අදාළ වියදම් | 6,042,526 | 15,224,206 | 20,827,188 |
| එකතුව | **64,984,755** | **83,257,997** | **90,712,231** |

## ප්‍රාග්ධන වියදම්

| විෂය විස්තර | 2009 (රු.) | 2010 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| අ). දැව භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිල දී ගැනීම් | 1,778,108 | 4,785,565 | 3,229,540 |
| ආ).යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම් | - | 38,915 | - |
| ඇ).ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්පත්කර ගැනීම් | - | - | - |
| ඈ).සෙසු | 385,397 | 1,474,784 | 10,073,420 |
| ඉ). ඉඩම් හා ගොඩනැගිලි පුණුරුත්ථාපන හා නවීකරණය | 2,851,066 | 7,845,552 | 3,243,526 |
| එකතුව | **5,014,571** | **14,144,816** | **16,546,486** |

## ව්‍යාපෘති (බාහිර / අභ්‍යන්තර ප්‍රතිපාදන මඟින්)

| වැය හා විස්තර | ණය / ප්‍රධානය | ප්‍රතිපාදන සැපැයීම | |
|---|---|---|---|
| ප්‍රධාන රාජ්‍ය නවයකරණ නිලධරයන් වෙනුවෙන් e-රාජ්‍ය වර්ධනය, පුහුණුව හා නිකුතුව සඳහා උපදේශන සේවා | ලෝක බැංකුව | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (TCE) | 21,190,000 |
| එකතුව | | | **21,190,000** |

## ව්‍යාපෘති වියදම් (බාහිර / අභ්‍යන්තර ප්‍රතිපාදන මගින්)

| මැය | TCE (රු.) | 2010 හි වියදම් (රු.) | 2011 හි වියදම් (රු.) | 2011.12.31 ට සමුච්චිත වියදම් | භෞතික ප්‍රගතිය - % |
|---|---|---|---|---|---|
| ප්‍රධාන නවීකරණ නිලධරයන් පුහුණු කිරීමේ වැඩ සටහන - CIO | 21,190,000 | 5,257,655 | 7,825,952 | 13,083,607 | (දළ වශයෙන්) |
| එකතුව | | | | | |

## මූල්‍ය ප්‍රගතිය (වියදම්)

| මූල්‍ය උත්පාදනය | 2011 හි ප්‍රතිපාදන (රු.) | 2011 වියදම් (රු.) | ඉතිරිය / ඉක්මවීම (රු.) |
|---|---|---|---|
| අ).පුනරාවර්තන – ව්‍යාපෘති හැර | 85,346,000 | 90,712,231 | (5,366,231) |
| ආ).ප්‍රාග්ධන – ව්‍යාපෘති හැර | 19,300,000 | 16,546,486 | 2,753,514 |
| ඇ).ව්‍යාපෘති දේශීය අරමුදලින් | - | - | - |
| ඈ).ව්‍යාපෘති විදේශීය අරමුදලින් | 7,825,952 | 7,825,952 | |
| එකතුව | | | |

## මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)

| මූල්‍ය උත්පාදනය | 2011 හි සැපැයුම (රු.) | 2011 එකතුව (රු.) | හර / බැර (රු.) |
|---|---|---|---|
| අ). උපාධි අපේක්ෂක අධ්‍යයන | - | - | - |
| ආ).පශ්චාත් උපාධි අධ්‍යයන | 74,700,000 | 53,907,639 | (20,792,361) |
| ඇ).උපදේශන සේවා | 4,500,000 | 4,693,850 | 193,850 |
| ඈ).සෙසු | 23,240,000 | 40,990,436 | 17,750,436 |
| එකතුව | **102,440,000** | **99,591,925** | **(2,848,075)** |

## 2011 මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විග්‍රහය

1997 වසරෙහි දී අරඹන ලද ස්ව-මූල්‍ය සම්පාදන ප්‍රතිපත්තිය අනුව මෙ ම වසර තුළ දී කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට කිසිදු (පුනරාවර්තන හා ප්‍රාග්ධන) ප්‍රතිපාදනයක් රාජ්‍ය මූල්‍ය සම්පත්වලින් නොලැබිණි. තව ද එම වසරේ සිට ම පුනරාවර්තන වියදම් සඳහා විශ්ව විද්‍යාලයීය ප්‍රතිපාදන කොමිසමෙන් හෝ භාණ්ඩාගාරයෙන් හෝ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොගන්නා ලදි.

| විෂයය | නිර්ණායකය | එක් ශිෂ්‍යයකු සඳහා වියදම |
|---|---|---|
| අ). එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම | පූවි./ මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව | 140,639 |
| ආ).එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාවි./ මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව | 25,653 |
| එකතුව | | |

## 2011 දී ලද යටිතල පහසුකම්

**ශාරීරික යෝග්‍යතා පුහුණු මධ්‍යස්ථානය :-**

ඉතා වැදගත් වන කාර්ය ජීවිතය හා ඉගෙනීම අතර තිබිය යුතු සමතුලිතතාව ඇති කර ගැනීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි වැඩ සටහන් හදාරණ සැලකිය යුතු ශිෂ්‍යයන් සංඛ්‍යාවකට හැකියාවක් නොපවතී. බෙහෙවින් ම මානසික ආතතියත් රෝගී බවත් ශාරීරික යෝග්‍යතාව කෙරෙහි සැලකිලිමත් නොවීමේ ප්‍රතිඵල වේ. මෙ ම අපේක්ෂාව සපුරාලීමට උක්ත මධ්‍යස්ථානය සහාය වේ. තව-තවත් පහසුකම් හා උපකරණ සහිත ව මෙ ම මධ්‍යස්ථානය තව දුරටත් වර්ධනය කෙරේ.

## සම්පිණ්ඩනය

වර්ධනය වන තරගකාරීත්වය මධ්‍යයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය එහි ප්‍රධාන වැඩ සටහන වන එම්.බී.ඒ පාඨමාලාවත් පසුගිය වසර ගණනක් ඔස්සේ තරගකාරී ව රැඳී පැවැතිණි. අදාළත්වයටත් ගුණාත්මක භාවයටත් සාර්ථකව බලපාන කරුණු දෙකක් වෙයි. එ නම් තෝරා ගන්නා ලද ප්‍රධාන වැඩ සටහන් වන එම්.බී.ඒ / එම්.පී.ඒ පාඨමාලා දිගින් දිගටම විශිෂ්ට ව සපුරාලමින්, වෙසෙසින් ම පෞද්ගලික අංශයෙහි විශේෂිත පුහුණු හා ප්‍රවර්ධන අවශ්‍යතාවලට ගැළපෙන අයුරින්ම සපුරාලන විවිධ විධායක ප්‍රවර්ධන වැඩසටහන් (EDP) කෙරෙහි ඉමහත් අවධානය යොමු කිරීම යි.

යටිතල පහසුකම් වර්ධනය කරමින් ආචාර්ය මණ්ඩල සම්පත්වල ගුණාත්මක හා සංඛ්‍යාත්මක වැඩි දියුණු වීම් ඉහතින් සඳහන් ලද අධ්‍යයන වැඩ සටහන් හා පුහුණු කටයුතු සැලැසුම් කරන ලද ලෙසින් ම ලබා දීමට උපකාරී වනු ඇත.

මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

2012 දෙසැම්බර් 04 දින

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**
**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය**

| විස්තරය | 2010 රු. | | 2011 රු. | |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| 1. ආයෝජන පොළී | 5,494,782.42 | | 6,973,047.52 | |
| 2. ණය හා අත්තිකාරම් පොළී | 127,747.58 | | 90,750.52 | |
| 3. දේපොළවලින් ලැබුණු කුලී | 3,359,717.00 | | 7,029,890.00 | |
| 4. පැරණි ගබඩා ද්‍රව්‍ය විකිණීම | 31,150.00 | | 15,450.00 | |
| 5. විවිධ ලැබීම් | 5,571,143.79 | | 4,311,061.72 | |
| 6. ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | 136,500.00 | | 162,000.00 | |
| 7. ඉගැන්වීම් ගාස්තු (පශ්චාත් උපාධි) | 109,843,545.69 | | 53,907,638.72 | |
| 8. විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | 300,000.00 | | 267,000.00 | |
| 9. වෘත්තීය කළමනාකරු සඟරාව | 19,350.00 | | - | |
| 10.අධ්‍යයන හා වෘත්තීය ලිවීමේ ග්‍රන්ථය | 268,878.00 | | - | |
| 11.අතිරික්ත පොත් විකිණීම | 147,400.00 | | 22,880.00 | |
| 12.ශ්‍රී ලාංකීය පාරිභෝගික පැතිකඩ සඟරාව | 35,700.00 | | - | |
| 13.C.I.O ව්‍යාපෘතිය | - | | 7,825,952.10 | |
| 14. ප්‍රකාශන විකිණීම | 1,130,195.00 | | 1,163,325.00 | |
| 15. පුස්තකාල දඩ හා ගාස්තු | 83,110.00 | | 304,580.00 | |
| 16. බාහිර පාර්ශවයන්ට සපයන ලද සේවා | 4,937,100.00 | | 4,693,850.00 | |
| 17. MPA වැඩසටහන් ගාස්තුව | 8,327,000.00 | | 6,229,500.00 | |
| 18. ජාත්‍යන්තර වැඩසටහන | 3,647,501.72 | | - | |
| 19. වාහන විකිණීම | - | | 1,065,000.00 | |
| 20. ඉල්ලුම්පත්‍ර ගාස්තු | - | | 690,500.00 | |
| 21. උපාධි ප්‍රදානෝත්සව ලැබීම් | 12,500.00 | | 4,839,500.00 | |
| **මුළු ආදායම** | | **143,473,321.20** | | **99,591,925.58** |
| **වියදම්** | | | | |
| a. සාමාන්‍ය පාලන සහ කාර්ය මණ්ඩල සේවා | 33,697,483.39 | | 37,692,954.01 | |
| b. අධ්‍යයන සේවා | 19,103,846.11 | | 27,543,635.60 | |
| c. ඉගැන්වීමේ සම්පත් | 1,556,976.02 | | 2,267,353.94 | |
| d. උපකාරක ක්‍රියාකාරකම් | 1,585,748.25 | | 2,381,098.79 | |
| e. බාහිර පාර්ශවයට සලසන සේවා | 4,585,340.50 | | 4,325,803.00 | |
| f. MPA වැඩසටහන | 4,149,959.20 | | 6,045,948.00 | |
| g. ජාත්‍යන්තර වැඩසටහන | 5,505,030.72 | | - | |
| h.CIO වැඩසටහන | - | | 7,825,952.10 | |
| i. විවිධ වියදම් | - | | 201,337.79 | |
| j. PIM වියදම් ප්‍රකාශන | 2,120,622.10 | | 2,428,147.88 | |
| **මුළු වියදම්** | | **(72,305,006.29)** | | **(90,712,231.11)** |
| **ක්ෂය ගැලපීමට පෙර වියදම් වැඩි ආදායම** | | **71,168,314.91** | | **8,879,694.47** |
| **ක්ෂය වීම්** | | (12,089,684) | | (9,927,896.26) |
| **වියදමට වැඩි ආදායම** | | **59,078,631.10** | | **(1,048,201.79)** |

* කරුණාකර I ඇමුණුම බලන්න

මහාචාර්ය උදිත ලියනගේ
**අධ්‍යක්ෂ**

ජේ. කේ. එස්. රණපුර
**සහකාර ලේකාධිකාරී**

පී. පී. මෛත්‍රීරත්න
**නියෝජ්‍ය මූල්‍යාධිකාරී**

ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන අධ්‍යාපන ගාස්තු පසුගිය වසර වලදී ගිණුම්ගත කරන ලද්දේ මූලය පදනමටයි. සමාලෝචිත වර්ෂය තුළ උපචිත පදනම මත නිවැරදි කරන ලදි.

| | 2010 | 2011 |
|---|---|---|
| වරද නිවැරදි කිරීමට පෙර අතිරික්තය / ඌනතාව | 59,078,631.10 | 35,464,085.89 |
| ගැළපීම් | | |
| අදාළ වර්ෂය වෙනුවෙන් පූර්ව වර්ෂයෙහි ලද ආදායම | 11,810,000.00 | 27,573,712.32 |
| | **70,888,631.10** | **63,037,798.21** |
| කලින් ලද ආදායම් | -27,573,712.32 | -64,086,000.00 |
| වරද නිවරදි කිරීමෙන් පසු අතිරික්තය / ඌනතාව | **43,314,918.78** | **-1,048,201.79** |

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය
## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විස්තරය | 2010 රු. | | සටහන් අංකය | 2011 රු. | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| අ. ඉඩම් හා ගොඩනැගිලි | 42,560,924.62 | | | 41,676,358.55 | |
| ආ. විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 8,856,796.64 | | | 8,329,734.94 | |
| ඇ.පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 2,684,631.88 | | | 5,093,523.33 | |
| ඈ. මෝටර් වාහන | 2,545,052.93 | | | 7,107,164.53 | |
| ඉ. උපාධි ලෝගු | 320,543.00 | | | 925,382.00 | |
| ඊ. කාර්යාලීය ලී බඩු හා සවිකිරීම් | 611,294.34 | | | 501,711.64 | |
| උ. කාර්යාලීය උපකරණ | 9,437,534.92 | | | 9,379,998.34 | |
| ඌ. යන්ත්‍ර සූත්‍ර | 54,615.00 | | 1 | 35,023.50 | |
| | | 66,430,307.33 | | | 73,048,896.83 |
| **ආයෝජන** | | 90,448,690 | 2 | | 101,375,290.00 |
| | | 156,878,997 | | | 174,424,186.83 |
| **ජංගම වත්කම්** | | | | | |
| අ. තොග | 825,418.80 | | 3 | 1,800,186.64 | |
| ආ. ජාත්‍යන්තර වැඩසටහන | 832,912.00 | | | - | |
| ඇ. විවිධ ණයගැතියෝ | 1,802,337.79 | | 4 | 1,641,000.00 | |
| ඈ. කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් | 2,482,566.00 | | 5 | 2,297,378.61 | |
| ඉ. විවිධ අත්තිකාරම් | 42,688.50 | | | - | |
| ඊ. කලින් ගෙවීම් | 20,516.75 | | | 148,014.25 | |
| උ. වෙනත් | 2,805,760.66 | | 6 | 5,249,850.99 | |
| ඌ. බැංකුව | 14,706,254.25 | | 7 | 36,697,932.65 | |
| එ. අතැති මුදල් | 349.00 | | | - | |
| | | 23,518,803.75 | | | 47,834,363.14 |
| **මුළු වත්කම්** | | **180,397,801.08** | | | **222,258,549.97** |

මහාචාර්ය උදිත ලියනගේ
**අධ්‍යක්ෂ**

ජේ. කේ. එස්. රණපුර
**සහකාර ලේකාධිකාරී**

පී. පී. මෛත්‍රීරත්න
**නියෝජ්‍ය මූල්‍යාධිකාරී**

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය
## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විස්තරය | 2010 | සටහන් | 2011 |
|---|---|---|---|
| | රු. | අංකය | රු. |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය** | | | |
| a.වැය වූ මූලධන ආධාර | 166,986,089.57 | | 166,986,089.57 |
| **සංචිත** | | | |
| a.පොදු සංචිත | (18,935,807.23) | | (45,092,300.52) |
| b.පරිත්‍යාග සංචිතය | 2,036,493.97 | | 2,036,493.97 |
| **සීමාකාරී අරමුදල්** | | | |
| a. අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 306,603.74 | 8 | 339,354.74 |
| b. ව්‍යාපෘති අරමුදල | - | | 5,457,640.82 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 7,564,523.00 | 9 | 7,342,067.00 |
| **ජංගම වගකීම්** | | | |
| a. කලින් ලද ආදායම් | - | | 64,086,000.00 |
| a. විවිධ ණය හිමියෝ | 10,538,133.62 | 10 | 9,676,443.06 |
| b. තැන්පතු | 4,085,684.44 | 11 | 2,458,393.61 |
| c. ණය හිමියෝ | 5,360,655.88 | 12 | 6,074,418.63 |
| d. වෙනත් | 2,455,424.09 | 13 | 2,893,949.09 |
| **මුළු වගකීම්** | **180,397,801.08** | | **222,258,549.97** |

මහාචාර්ය උදිත ලියනගේ
**අධ්‍යක්ෂ**

ජේ. කේ. එස්. රණපුර
**සහකාර ලේකාධිකාරී**

පී. පී. මෛත්‍රීරත්න
**නියෝජ්‍ය මූල්‍යාධිකාරී**

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
## ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය

| | ප්‍රාග්ධනය | පොදු සංචිතය | පරිත්‍යාග සංචිතය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| 2009 දෙසැම්බර් 31 දිනට ශේෂය | 143,742,531.00 | (44,904,308.35) | 1,593,842.00 | 100,432,064.65 |
| ගැළපීම් | 23,243,558.57 | (33,110,129.98) | - | (9,866,571.41) |
| යළි ස්ථාපිත ශේෂය | 166,986,089.57 | (78,014,438.33) | 1,593,842.00 | 90,565,493.24 |
| UNDP ව්‍යාපෘතිය | - | - | 442,651.97 | 442,651.97 |
| අතිරික්තය | - | 59,078,631.10 | - | 59,078,631.10 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 166,986,089.57 | (18,935,807.23) | 2,036,493.97 | 150,086,776.31 |
| ගැළපීම් | - | (25,108,291.50) | - | (25,108,291.50) |
| යළි ස්ථාපිත ශේෂය | 166,986,089.57 | (44,044,098.73) | 2,036,493.97 | 124,978,484.81 |
| අතිරික්තය | - | (1,048,201.79) | - | (1048201.79) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | **166,986,089.57** | **(45,092,300.52)** | **2,036,493.97** | **123,930,283.02** |

මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ

ජේ. කේ. එස්. රණපුර
සහකාර ලේකාධිකාරී

පී. පී. මෛත්‍රීරත්න
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

# කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය – 2011

| | 2010 | 2011 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | රු . | රු . |
| අතිරික්තය | 59,078,631.10 | (1,048,201.79) |
| | | |
| **මුදල් ප්‍රවාහයක් ජනිත නොවූ අයිතමයන් හා ගැලපුම්** | | |
| ක්‍ෂය වීම් | 12,089,683.81 | 9,927,896.26 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 521,380.00 | 998,065.00 |
| ණය හා අත්තිකාරම් වලින් පොළිය | - | (36,997.06) |
| වාහන විකිණීම් | - | (1,065,000.00) |
| ආයෝජන සඳහා පොළී | (5,494,782.42) | (6,973,047.52) |
| පූර්ව වර්ෂ ගැලපීම් | 83,760.17 | - |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | **66,278,672.66** | **1,802,714.89** |
| තොගයේ වැඩි වීම | (475,806.80) | (141,855.84) |
| විවිධ ණය හිමියන්ගේ වැඩි වීම | 619,930.00 | 296,073.40 |
| විවිධ අත්තිකාරම් අඩු වීම | 509,662.50 | 42,688.50 |
| කලින් ගෙවීම් අඩු වීම | 60,975.25 | (127,497.50) |
| විවිධ ණය ගැතියන්ගේ අඩු වීම | - | 161,337.79 |
| පාරිතෝෂික අඩු වීම | - | (431,812.50) |
| ණය හා අත්තිකාරම් පොළී අඩු වීම | - | 36,997.06 |
| වෙනත් වත්කම් වැඩි වීම | - | (2,444,090.33) |
| තැම්පතු අඩු වීම | 446,119.00 | (1,627,290.83) |
| උපචිත වියදම් වැඩි වීම | (1,023,659.12) | 713,762.75 |
| කලින් ලද ආදායම් වැඩි වීම | - | 64,086,000.00 |
| සෙසු වැඩි වීම (බැරකම්) | 1,141,283.45 | 438,525.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,278,504.28** | **61,002,837.50** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ඉඩම් හා ගොඩනැගිලි මිලට ගැනීම | (7,555,815.59) | (3,243,526.00) |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ මිලට ගැනීම | (1,546,940.00) | (1,257,910.00) |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන මිලට ගැනීම | (1,474,784.00) | (3,074,619.64) |
| උපාධි ලෝගු මිලදී ගැනීම් | - | (1,248,800.00) |
| වාහන මිලදී ගැනීම් | - | (5,750,000.00) |
| කාර්යාල උපකරණ මිලට ගැනීම | (3,316,454.94) | (1,971,630.12) |
| වාහන විකිණීම් | - | 1,065,000.00 |
| අත්තිකාරම් හා ණය අඩුවීම් | - | 185,187.39 |
| යන්ත්‍රෝපකරණ මිලට ගැනීම් | 38,915.00 | - |
| ආයෝජන | (54,000,000.00) | (10,926,600.00) |
| ආයෝජන වලින් ලැබුණ පොලී | 3,365,451.48 | 6,973,047.52 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(64,489,628.05)** | **(19,249,850.85)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| පොදු සංචිතය | - | (25,897,000.00) |
| CIO ව්‍යාපෘති අරමුදල | - | 5,457,640.82 |
| අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 32,750.74 | 32,751.00 |
| වාහන කල්බදු | (1,073,691.38) | (1,157,763.96) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,040,940.64)** | **(21,564,372.14)** |
| | | |
| මුදල් හා මුදල් වලට සමාන අයිතමයන්හි වැඩි වීම | 2,026,608.25 | 21,991,329.40 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් නොවන අයිතමයන් | 12,679,995.00 | 14,706,603.25 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් නොවන අයිතමයන්** | **14,706,603.25** | **36,697,932.65** |

| | | |
|---|---|---|
| මහාචාර්ය උදිත ලියනගේ | ජේ. කේ. එස්. රණපුර | පී. පී. මෛත්‍රීරත්න |
| **අධ්‍යක්ෂ** | **සහකාර ලේකාධිකාරී** | **නියෝජ්‍ය මූල්‍යාධිකාරී** |

සටහන්-01

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
## ජංගම නොවන වත්කම්- 2011

(රු.)

| විස්තරය | 2011-01-01 දිනට ශේෂය | 2011 වර්ෂයේ මිලදී ගැනීම් | 31/12/2011 දිනට මුළු ශේෂය | 01/01/2011 දිනට සම්මුචිත ක්ෂය | 2011 ක්ෂයවීම් | මුළු ක්ෂයවීම් | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| පුනරුත්ථාපනය හා නවීකරණය | 21,945,630.26 | 3,243,526.00 | 25,189,156.26 | 2,866,453.89 | 1,097,281.51 | 3,963,735.40 | 21,225,420.86 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | 20,709,199.65 | 523,097.62 | 21,232,297.27 | 15,591,322.87 | 59,339.90 | 15,650,662.77 | 5,581,634.50 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 23,874,015.31 | 1,257,910.00 | 25,131,925.31 | 15,017,218.67 | 1,784,971.70 | 16,802,190.37 | 8,329,734.94 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 16,958,065.25 | 3,074,619.64 | 20,032,684.89 | 14,273,433.37 | 665,728.19 | 14,939,161.56 | 5,093,523.33 |
| මෝටර් රථ<br>මෝටර් රථ අපහරණය | 9,547,117.00 | 5,750,000.00 | 15,297,117.00<br>(2,600,000.00) | 7,002,064.07 | 1,187,888.40 | 8,189,952.47<br>(2,600,000.00) | 7,107,164.53 |
| ලෝගු | 825,727.00 | 1,248,800.00 | 2,074,527.00 | 1,146,270.00 | 2,875.00 | 1,149,145.00 | 925,382.00 |
| කාර්යාල ලී බඩු හා සවිකිරීම් | 2,872,377.04 | 177,655.00 | 3,050,032.04 | 2,261,082.70 | 287,237.70 | 2,548,320.40 | 501,711.64 |
| කාර්යාල උපකරණ | 14,765,439.73 | 1,270,877.50 | 16,036,317.23 | 10,445,781.59 | 1,792,171.80 | 12,237,953.39 | 3,798,363.84 |
| යන්ත්‍රෝපකරණ | 195,915.00 | - | 195,915.00 | 141,300.00 | 19,591.50 | 160,891.50 | 35,023.50 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 60,616,211.37 | - | 60,616,211.37 | 42,134,463.12 | 3,030,810.56 | 45,165,273.68 | 15,450,937.69 |
| ඉඩම් | 5,000,000.00 | - | 5,000,000.00 | - | - | - | 5,000,000.00 |
| **එකතුව** | **177,309,697.61** | **16,546,485.76** | **191,256,183.37** | **110,879,390.28** | **9,927,896.26** | **118,207,286.54** | **73,048,896.83** |

මගේ අංකය / எனது இல / My No. සීඊ/ඊ/පීඅයිඑම්/ එෆ්ඊ/2011

මබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2012 ජුනි 11 දින

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඊ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1) හා 111 වගන්ති හා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය හා මුදල් පනතේ 13(7)(ඊ) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ විගණන වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2012 මාර්තු 27 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 29 අනුව ආයතනය විසින් උපචිත පදනම මත ආදායම් හඳුනාගෙන සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 30 දින ඉදිරිපත් කෙරුණි. එහෙත් 2010/2012 E-රාජ්‍ය වැඩසටහන සඳහා CIO(Chief Innovation Officer) නිලධාරීන් පුහුණු කිරීමේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන සඳහා 2011 වර්ෂයේ පාඨමාලා ගාස්තු ලෙස අයකර තිබූ රු.10,806,899කින් වර්ෂයට අදාල ආදායම හදුනා ගෙන ගිණුම් ගත කරනු වෙනුවට පදනමකින් තොරව වර්ෂයේ වියදම වූ රු.7,825,952ට සමාන මුදලක් ආදායම ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් භාවිතයට ගනු ලබන පිරිවැය රු.49,158,132ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වූ නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ එකතුව රු.6,393,536ක් වූ ගිණුම්කරණ අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක වෙත 2012 මාර්තු 27 දිනැති කළමනාකරණ වාර්තාව මගින් යොමු කරන ලද අතර එම අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින විගණනයට ඉදිරිපත් කෙරුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සේවයෙන් ඉවත්ව ගිය සේවකයින්ගෙන් අයවිය යුතු සේවක ණය රු.95,097ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් වූ රු.6,074,419ක් තුළ 2006 වර්ෂයේ සිට පැවතෙන හඳුනා නොගත් රු.690,668ක් හා විදේශීය ශාඛාවේ වර්ගීකරණය නොකළ උපචිත වියදම් රු.3,743,217ක් ඇතුළත් වී තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර ශාඛාවේ රු.2,911,912ක්වූ ලැබිය යුතු ගිණුම් හා රු.11,603,207ක් වූ ගෙවිය යුතු ගිණුම් වර්ෂ 03ක කාලයක සිට පර්ශේෂව පවතින අතර එම ශේෂ වල පැවැත්ම ශේෂ තහවුරු කිරීම් මගින් සනාථ කර ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම රු.5,000,000ක් ලෙස දක්වා ඇති ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමෙහි ඔප්පුව විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

### 2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි හා කළමනකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත හා දේශීය ආදායම් කොමසාරිස්(උ.වි.ගෙ.)ගේ අංක අයිආර්ඩී/පීඒවයිර්/ආර්ර්ජ්/01 හා 2011 මාර්තු 07 දිනැති ලිපිය | නිත්‍ය සේවා නියුක්ති ලාභය නිසිලෙස ගණනය නොකිරීම නිසා ආයතනයේ නිලධාරීන් 12 දෙනෙකුට අදාලව රු.624,112ක් බදු අඩුවෙන් අයකර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| (ආ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ බදු පනත | සමාලෝචිත වර්ෂය තුළ දී උපයා තිබූ රු.136,104,213 ක් වූ ආදායම මත රු.2,722,084 ක් වූ ජාතිය ගොඩනැගිමේ බදු ගෙවා නොතිබුණි. |
| (ඇ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | සමාලෝචිත වර්ෂය තුළ දී උපයා තිබූ රු.136,104,213 ක ආදායම මත, රු.340,260 ක් වූ ආර්ථික සේවා ගාස්තු ගෙවා නොතිබුණි. |
| (ඈ) මුදල් රෙගුලාසි 751 හා 756 | ආයතනය විසින් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයද සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන සංග්‍රහයේ 3.4 වගන්තිය | මිල ගණන් කැඳවීමකින් තොරව 2008 වර්ෂයේ සිට ජායා පිටපත් සේවයක් හා ලිපිද්‍රව්‍ය අලෙවි සැලක් පවත්වාගෙන යාම සඳහා ආයතන පරිශ්‍රයෙන් කොටසක් බාහිර පුද්ගලයකු වෙත ලබාදී තිබුණි. |

2.2.6 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගණුදෙණු

1985 අංක 03 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ (8)(iii)(ජ) ප්‍රකාරව ආයතනයට අයත් කවර මුදලක් වුවද ආයෝජනය කිරීමට හා එවැනි ආයෝජන වෙනස් කිරීමට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 35 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීමට මෙන්ම රු.මිලියන 06ක් ස්ථාවර තැන්පතු වලින් ඉවත් කිරීමට අවශ්‍ය නිසි අනුමැතිය ලබා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,048,201ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.59,078,631ක් විය. පූර්ව ව ර්ෂයට සාපේක'ෂව ස මාලෝචිත වර් ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.60,126,832ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ඊට ප්‍රධාන හේතු වූයේ සමාලෝචිත වර්ෂයේ සිට උපචිත පදනම මත ආදායම් හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 44 කින් අඩුවීම සහ සාමාන්‍ය පරිපාලන හා අධ්‍යයන කාර්යමණ්ඩල වියදම් රු.මිලියන 12කින් වැඩිවීමත්ය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 415ක් විය. ආයතනය පශ්චාත් උපාධි පාඨමාලා 9කට අදාලව සිසුන් 438ක් සඳහා 2011 වර්ෂයේ උපාධි පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ උපදේශක වැඩමුළු 06ක් පවත්වා තිබුණි.

4.2 නිශ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්

------------------------------------

බැංකු ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂය තුල (ඔක්තෝබර් මාසය හැර) රු.මිලියන 9 සිට රු.මිලියන 30 දක්වා ශේෂයක් පැවතුණු අතර මෙම අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් ඉපයීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

4.3 ආර්ථික නොවූ ගණුදෙනු

----------------- ---------

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සේවය කල නියෝජ්‍ය මූලාධිකාරී 2010 සැප්තැම්බර් 07 දින සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුයුක්ත කර තිබුණු අතර තම ආයතනයට සේවයක් ලබාගැනීමකින් තොරව මාස 06 ක කාලයක් සඳහා (2010 සැප්තැම්බර් මස සිට 2011 පෙබරවාරි දක්වා) වැටුප් ලෙස රු.315,235ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

---------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

--------------------

2009/2011 සංයුක්ත සැලැස්මට ඇතුලත් නොවූ ආයතන ගොඩනැගිල්ලේ II වන අදියරේ වියදම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වෙන් කල රු.මිලියන 15 ක ප්‍රතිපාදනද ඇතුලත්ව 2011 අයවැයෙන් රු. මිලියන 60ක ප්‍රතිපාදනය කර තිබු නමුත් වර්ෂය තුල අපේක්ෂිත පරිදි ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

----------------------

අංක 216.10 හා 2011 අගෝස්තු 24 දිනැති කළමනාකරණ මණ්ඩල පත්‍රිකාවට අනුව 2011 වර්ෂයේ විගණන කටයුතු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක හා සහායක විගණකවරයෙකු වෙත පවරා වැඩසටහන් අනුමත කර ඇතත් වර්ෂය තුල අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

5.3 විගණන කමිටුව

----------------

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛ අංක PED/12 ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

5.5 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ වැය විෂයන් 04ක වියදම්, වාර්ෂික වැය ඇස්තමේන්තුව සමඟ සලකා බැලීමේදී 38% සිට 207% දක්වා වූ ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කළමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

අ) ස්ථාවර වත්කම්

ආ) ගිණුම්කරණය

ඇ) තොග ලේඛන පවත්වාගෙන යාම

ඈ) භාණ්ඩ හා සේවා මිල දී ගැනීම

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව ප්‍රකාර ආයතනයේ අදහස් දැක්වීම.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

(අ) 2010/2012 E- රාජ්‍ය වැඩ සටහන යටතේ CIO (Chief Innovation Officer) නිලධාරීන් පුහුණු කිරීමේ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනුයේ ඒ සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයක් පදනම් කොට ගෙන ආයතනය වෙත ලැබුන රු. මිලියන 21.2 ක ව්‍යාපෘති ප්‍රදානයක අරමුදල් වලිනි. මෙම අරමුදල් අවශ්‍යතාවය මත වරින් වර ආයතනය වෙත නිදහස් කෙරේ. ඒ අනුව 2011 වර්ෂයේ දී ලැබුන මුදල් ප්‍රමාණය රු.10806899.00 කි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2011 වර්ෂයේ අවසන්ව නොතිබුණ නිසා ආදායම් අතිරික්තයක් හඳුනා ගැනීම දුෂ්කර විය. ව්‍යාපෘති වියදම් ව්‍යාපෘති අරමුදල් ගිණුමට හරකිරීම මගින් එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන වලින් මගහැරී යාම වැලැක්වීමට වියදමට සමාන වටිනාකමක් ව්‍යාපෘති අරමුදල් ගිණුමට හර කොට ආදායමක් ලෙස ගිණුම් වාර්තාවලට ඇතුළත් කරන ලදි. මෙම ව්‍යාපෘතිය 2012 වසරේදී අවසන් වන බැවින් ආදායම් අතිරික්තයක් පවතිනම් එම අවස්ථාවේ ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද නමුත් දැනට භාවිතයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කොට අදල ගැලපුම් ගිණුම්ගත කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) රු124957.00 ක ණය මුදලින් රු.38310.00 ක ප්‍රමාණය ප්‍රවර්තන සේවකයෙකුගෙන් අයවෙමින් පවතින මුදලින් ඉතිරිව ඇති ශේෂය වේ. රු.86647.00 ක් වූ ඉතිරි මුදල සේවය හැරගිය සේවකයින් දෙදෙනෙකුට අදල වන අතර එම සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කරන විට ණය ශේෂය අයකර ගැනීමට පියවර ගනු ලැබේ.

(ආ) 2006 වර්ෂයේ සිට ඉදිරියට එන හඳුනානොගත් උපචිත වියදම් 2012 වර්ෂයේ ආදායමට බැර කිරීමට විධිවිධාන යොදා ඇත. විදේශීය ශාඛාවේ වර්ගීකරණය නොකල උපචිත වියදම් පිළිබඳ විස්තර එම ශාඛාවේ කටයුතුවලට අදල විමර්ශනය අවසන් වන තෙක් ලබාගැනීමේ දුෂ්කරතාවයක් පවතී.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) ජාත්‍යන්තර ශාඛා ශේෂ පත්‍රයේ 2009-03-31 දිනට පැවැති ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් ඉදිරියට ගෙනැවිත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. ජාත්‍යන්තර ශාඛාවේ කටයුතු පිළිබඳ සිදුකෙරෙන විමර්ශනය මගින් අදළ තොරතුරු අනාවරණය කර ගැනීම අපේක්ෂා කෙරේ.

(ආ) ඉඩමේ අයිතිය තහවුරු කෙරෙන හිමිකම් ඔප්පුවේ පිටපතක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.2.5 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

(අ) උපයන විට ගෙවීමේ පදනම මත රාජ්‍ය ආයතන වලින් බදු අය කිරීම බලාත්මක කරන ලද්දේ 2011 අප්‍රේල් 1 දිනෙන් ආරම්භ වු තක්සේරු වර්ෂයේ සිටයි. මෙම තක්සේරු වර්ෂයේ මුල් මාස කිහිපය තුල ගණනය කරන ලද බදු ප්‍රමාණය හා චක්‍රලේඛ උපදෙස් අතර නොගැලපීමක් පැවැතීම නිසා රු. 624112.00 ක බදු අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. එම ප්‍රමාණය අදල නිලධාරීන්ගේ ඉදිරි මාසවල ඉපයීම් වලින් අඩුකොට දේශීය අදයම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2011 අංක 10 දරණ ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත මගින් රජයේ දෙපාර්තමේන්තුවක්, අමාත්‍යංශයක් හෝ රජයට සම්පූර්ණයෙන්ම අයත් ආයතනයක් කරනු ලබන සේවා සැපයීම් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කොට ඇති නිසා බදු ගෙවීම සිදු නොකරන ලදි. මේ සම්බන්ධයෙන් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසන ලදුව ඔවුන්ගේ මතය වනුයේ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් සපයන සේවා ජාතිය ගොඩනැගීමේ බදු නිදහසට අයත් නොවන බවයි. එබැවින් බදු ලිපිගොනුවක් විවෘත කිරීම සඳහා අයදුම්පතක් මේ වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කොට ඇත.

(ඇ) ආර්ථික සේවා ගාස්තු ගෙවීමට බදු ලිපිගොනුවක් විවෘත කිරීමට විධිවිධාන යොදා ඇත.

(ඈ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනය සකස් කිරීමේ කටයුතු ආරම්භ වී ඇති අතර භාණ්ඩ සමීක්ෂණය සඳහා මණ්ඩලයක්ද මේ වන විට පත්කොට ඇත.

(ඉ) ආයතනයේ දේශන පැවැත්වෙනුයේ සතියේ දිනවල ප.ව 6.00-10.00 අතරය. එම වේලාව තුල සිසුන්ට අවශ්‍ය ඡායාපිටපත් පහසුකම් සැලසීමේ අරමුණින් ආයතනය ඉදිරිපස ඡායාපිටපත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන පුද්ගලයෙකුගේ සේවය පැයකට පමණ කාලයකට ලබාගනු ලැබේ. ඔහු විසින් භාවිත කරනු ලබන්නේ ඔහුටම අයත් එක් ඡායාපිටපත් යන්ත්‍රයක් පමණි. දිනකට පැයක තරම් කාලයක් ක්‍රියාත්මක වන, ඉතා සුලු ආදායමක් ලබන කාර්යයක් බැවින් ටෙන්ඩර් කැඳවීම එතරම් ප්‍රායෝගික නොවන බව පෙනේ. කෙසේ වෙතත් 2012 වසරේදී මේ සඳහා ටෙන්ඩර් කැඳවා මෙම ඡායාපිටපත් සේවාව සැපයීමේ කාර්යය සිදුකිරීමට පියවර ගනු ලැබේ.

## 2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) කළමනාකරණ මණ්ඩලය මාසිකව රැස් නොවන බැවින්, තැම්පතු ආයෝජනය හා තැම්පතු ආපසු ගැනීම කළමනාකරණ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව සිදුකරන ලදි. 2012 වර්ෂයේ දෙවන කාර්තුවේ පැවැත්වෙන කළමනාකරණ මණ්ඩලයේ ප්‍රථම රැස්වීමේ අනුමැතිය සඳහා මෙය ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.

## 4.2 නිශ්ක්‍රීය ඌන උපයෝජන වත්කම්

ආයතනයට ලැබෙන ආදායම් හා ආයතනික වියදම් සැලැකිල්ලට ගෙන ආයතනික කටයුතු වලදී ද්‍රවශීලතා ගැටළු මතු නොවන පරිදි අතිරික්ත මුදල් ආයෝජනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේදී ද රු. මිලියන 15ක මුදල් ආයෝජනයක් සිදුකර ඇත.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

අදල නියෝජ්‍ය මූල්‍යාධිකාරී වරයා විනයානුකූල හේතු මත, කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් පරිදි 2010.09.07 දින සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අනුයුක්ත කළ අතර ඔහුට ස්ථාන මාරුවීමක් ලබා දී නොමැත. එම නියෝජ්‍ය මූල්‍යාධිකාරී වරයා සම්බන්ධයෙන් පවත්වන විනය පරීක්ෂණ අවසන් කර තීරණයක් ගන්නා තෙක් අදල වැටුප් ආයතනයෙන් ගෙවන ලදි. එහෙත් එම මූල්‍යාධිකාරී විසින් අවසන් වරට ඉල්ලුම් කළ සේවා දිගුව ලබා දීම ආයතනයේ කළමනාකරණ මණ්ඩලය ප්‍රතික්ෂේප කල බැවින් 2011 පෙබරවාරි මාසයේ සිට වැටුප් ගෙවීම සිදු කර නොමැත.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

ආයතන ගොඩනැගිල්ලේ දෙවන අදියරේ කටයුතු 2012 වසරේදී ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. භාණ්ඩාගාරයේ එකඟතාවය ලැබී ඇති මෙම ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇත. හැකිතාක් දුරට මෙම ආයතනය උපයන අරමුදල් ප්‍රයෝජනයට ගෙන ගොඩනැගිලි ව්‍යාපෘතිය නිමකිරීමට අදහස් කරනු ලැබේ.

## 5.2 අභ්‍යන්තර විගණනය

2011 අගෝස්තු මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් බැවින් අදල විගණන කටයුතු සිදුකරවා ගැනීමේ ප්‍රමාදයක් පවතුනි. 2012 වර්ෂයේදී මෙම විගණන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.

## 5.3 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන ලද අතර මෙම රැස්වීම් සංඛ්‍යාව වැඩිකිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන කටයුතු ඉඩා අඩු ප්‍රමාණයක් සිදුවන බැවින් සමාලෝචිත වර්ෂයට අදල ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොමැති නමුත් 2012 වර්ෂයට අදල ප්‍රසම්පාදන සැලැස්ම දැනටමත් සකස් කොට ඇත.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

අනපේක්ෂිත හා හදිසි තත්වයන් මත දැරීමට සිදුවන වියදම් හේතුවෙන් අයවැය ප්‍රතිපාදනවලට සාපේක්ෂව ඇතැම් වැය ශීර්ෂවල විචලනයක් පවතී. මෙම තත්වය ඉදිරියේදී හැකිතාක් අවම කරගැනීමට පියවර ගනු ලැබේ.



අධ්‍යක්ෂ

නොවැම්බර් 26, 2012